# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

## 2018

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

நன்னடத்தை, சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களம்
பீ பிரிவு, 3 ஆம் மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.

**Department of Probation and Child Care Services**
**Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla.**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**
**බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.**

# පෙළගැස්ම


**1. හැඳින්වීම 6**

1.1 දෙපාර්තමේන්තු ඉතිහාසය ....7

1.2 පළාත් සභා පිහිටුවීම සහ දෙපාර්තමේන්තුවේ බලතල....8

1.3 අපගේ දැක්ම....9

1.4 අපගේ මෙහෙවර....9

1.5 අපගේ අගයයන්....9

1.6 අපගේ කැපවීම....10

1.7 වැඩසටහන්....11

1.8 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය යෙදවීම ....11

**2. ආයතන හා පරිපාලන අංශය 14**

2.1 ආයතන හා පරිපාලන අංශයේ මූලික කාර්යයභාරය....15

2.2 පුහුණු වැඩසටහන්හා පර්යේෂණ ....16

2.2.1 ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් ....16

2.2.2 ළමා නිවාස නිළධාරී කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන....18

2.2.3 ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි සම්පත්දායක සංචිතය ....18

2.2.4 ළමයින් සම්බන්ධව කටයුතු කරන ඒකාබද්ධ නිලධාරී පුහුණුව....19

**3. ගිණුම් අංශය 20**

3.1 මූල්‍ය ප්‍රගතිය ....21

3.2 විගණන නිරීක්ෂණය....22

**4. පරිවාස අංශය 22**

4.1 හැඳින්වීම ....25

4.2 පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය....26

4.3 ළමා නිවාස ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම ....27

4.4 ආයතනගත දරුවන්ගේ කුසලතා වර්ධනය....29

4.5 ළමා නිවාස අධීක්ෂණය ....30

4.6 තැනැත්තන් වෙළඳාම පිළිබඳව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරීන් දැනුවත් කිරීම ....32

4.7 අධිකරණවල සිට ළමා සුරැකුම් මධ්‍යස්ථාන වෙත ළමුන් ප්‍රවාහනය....33

4.8 පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු යටතේ සේවය කරනු ලබන පරිවාස නිලධාරීන් පුහුණු කිරීම....34

4.9 දරුකමට හදාවඩා ගැනීම්.......................................................................34
4.3 විදේශ හදාවඩා ගැනීම් සඳහා වෙන් කළ දරුවන් - 2018 ...............................35

**5. සංවර්ධන අංශය 36**

5.1 හැඳින්වීම ........................................................................................ 37
5.2 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා අධ්‍යාපන අධාර…….. ….38
5.3 කැපකරු දෙගුරු වැඩසටහන.......................................................................40
5.4 නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය ..........................................................41
5.5 නිවුන් දරු ආධාර.....................................................................................42
5.6 වෛද්‍ය ආධාර........................................................................................43
5.7 හදිසි විපත් ආධාර ..................................................................................45
5.8 සෙනෙහස ඉතිරි කිරීමේ ගිණුම ................................................................46
5.9 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය .........................................................47
5.10 ළමා සමාජ හා ළමා සභාව ව්‍යාපෘතිය.........................................................47
5.11 වීදි දරු සුභසාධන වැඩසටහන...................................................................53
5.12 ළමා මිතුරු ආදර්ශ ගම්මාන වැඩසටහන ......................................................53
5.13 ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු වැඩසටහන ……………......................................................................................54
5.14 දැනුවත් කිරීමේ වැඩසටහන ......................................................................55
5.15 ලෝක ළමා දිනය .....................................................................................56
5.16 ආරක්ෂණ සැළසුම් සකස් කිරීම ...............................................................…57
5.17 ළමා මූලික පර්යේෂණය ............................................................................58
5.18 ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන..........................….. 59
5.19 ළමා හිංසනය අවසන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සංවිධානය.....60
5.20 මාසික සහ වාර්ෂික ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන මාර්ගගත දත්ත පද්ධතිය ..60
5.21 ශ්‍රී ලාංකික දරුවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික සිද්ධි කලමනාකරණ මාර්ගෝපදේශ................................................60
5.22 තුන් අවුරුදු ප්‍රාදේශීය සැලසුම ............................................................... 60
5.23 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාසවාසී දරුවන්ගේ ළමා ආරක්ෂාව සහතික කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 63



# 01

# හැඳින්වීම

## 1.1 දෙපාර්තමේන්තු ඉතිහාසය

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුළින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය.එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරීමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩින් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරින් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ග්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලින් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

මෙසේ 1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දි සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2018 වර්ෂයේ සිට මේ දක්වා කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

## 1.2 පළාත් සභා පිහිටුවීම සහ දෙපාර්තමේන්තුවේ බලතල

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරු ද අහෝසි විය.පළාත් සභා යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්ෂක විෂයයට ද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

## 1.3 අපගේ දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

## 1.4 අපගේ මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

## 1.5 අපගේ අගයයන්

- දරුවා කේන්ද්‍ර කොට ගැනීම
- දයාව / කරුණාව පෙරදැරි කර ගැනීම
- සහයෝගී ප්‍රවේශය
- මනා කැපවීම
- සංහිඳියාව

## 1.6 අපගේ කැපවීම

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම

## 1.7 වැඩසටහන්

- ❖ පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- ❖ විදේශීය හදාවඩා ගැනීම්
- ❖ ළමුන් ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය මඟින් අසරණ ළමයින්ට අවශ්‍ය සහන සැලසීම
    - නැණ දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහන ක්‍රියාත්මක කිරීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
- ❖ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා බල ගැන්වීම
- ❖ ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ❖ පුහුණු හා පර්යේෂණ කටයුතු
- ❖ උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

## 1.8 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩලය යෙදවීම

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙක්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයකු, ගණකාධිකාරීවරයෙකු, නීති නිළධාරියකු, පරිපාලන නිලධාරී වරයෙකු, ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරියෙකු , පරිවාස නිලධාරියෙකු, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දෙසිය තිස්දෙදෙනෙකු ගෙන් සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යුහයට අයත් වන අංශ :-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් යුතුව කටයුතු කරනු ලැබේ. සමස්ත කාර්ය මණ්ඩලය 490 ක් වන අතර දැනට එය පහත සඳහන් පරිදි 447 දෙනෙකුගෙන් සමන්විත වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ. – I) | 01 | 01 |
| නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ. | 02 | 01 |
| සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | 01 | 01 |
| ගණකාධිකාරී | 01 | 01 |
| නීති නිළධාරී | 01 | 00 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි | 01 | 01 |
| භාෂා පරිවර්තක | 02 | 01 |
| පරිවාස නිලධාරී | 02 | 00 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 01 | 01 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී (CRPO) | 424 | 229 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර (CRPA) | | 168 |
| සංවර්ධන නිලධාරි (ප්‍රධාන කාර්යාලය/පරත්ත) | 12 | 10 |
| මනෝ උපදේශක | 02 | 00 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | 00 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 14 | 15 |
| ලඝු ලේඛක | 01 | 00 |
| නොවිධිමත් අධ්‍යාපන උපදේශිකා | 01 | 01 |
| සහකාර වෝර්ඩන් | 03 | 03 |
| රියදුරු | 04 | 04 |
| කාර්යාල සේවක සේවය | 10 | 07 |
| අරක්කැමි | 02 | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 | - |
| මුලු එකතුව | 490 | 447 |



# 02

# ආයතන හා පරිපාලන අංශය

## 2.1 ආයතන හා පරිපාලන අංශයේ මූලික කාර්යයභාරය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අදාල ආයතන කටයුතු

- පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවට අදාල නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාන මාරු කිරීම සහ විනය සම්බන්ධ කටයුතු
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩඉම් සහ ප්‍රවීණතා පරීක්ෂණ පැවැත්වීම
- සියළුම කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ පවත්නා දැනුම වඩාත් වර්ධනය කිරීමටත්, නව සංවර්ධන ක්‍රමෝපායන් හඳුන්වාදීමටත්, නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුවීම් හා දැනුම ලබා දීමටත් කටයුතු කරන ලදි. ඒ අනුව,.

- ආයතන කටයුතු ,මූල්‍ය හා ගිණුම් කටයුතු පිලිබඳ පුහුණුවීම් සහ සේවක අභිප්‍රේරණ පුහුණු කටයුතු සඳහා රු. 250,000/- ක මුදලක් වෙන් කෙරුනි.

| පුහුණු වැඩ සටහනේ නම | නිලධාරීන් සංඛ්‍යාව | වැය වූ මුදල |
|---|---|---|
| කාර්යාල කළමනාකරණ සහ කාර්යාල ක්‍රමවේද | 2 | 17,000.00 |
| ගිණුම්කරණ කාර්යයභාරය හා ප්‍රායෝගික භාවිතය | 1 | 6,000.00 |
| සේවක අභිප්‍රේරණ වැඩ සටහන | 68 | 154,800.00 |
| ඉංග්‍රීසි භාෂා අධ්‍යයන පුහුණු පාඨමාලාව | 1 | 35,000.00 |
| තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 35,000.00 |
| එකතුව | 82 | 247,800.00 |

- දෙපාර්තමේන්තුගත නිළධාරීන් ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් ගේ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු වලින් 50% - 75 % දක්වා මුදලක් ගෙවීමට කටයුතු කෙරිනි. ඒ සඳහා රු. 436,970/- ක මුදලක් වෙන් කෙරුනි

| උපාධි/පුහුණු වැඩ සටහනේ නම | නිලධාරීන් සංඛ්‍යාව | වැය වූ මුදල රු. |
|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1 | 17,500.00 |
| දෙමළ භාෂා ලේඛන - II අදියර | 1 | 11,550.00 |
| සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | 2 | 119,420.00 |
| පවුල් උපදේශනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 2 | 42,000.00 |
| රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 1 | 147,500.00 |
| සංගීත චිකිත්සාව පිළිබඳ වැඩමුළුව | 1 | 4,500.00 |
| දර්ශන විශාරද උපාධිය | 1 | 24,500.00 |
| උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2 | 70,000.00 |
| එකතුව | 11 | 436,970.00 |

## 2.2 පුහුණු වැඩසටහන් හා පර්යේෂණ

### 2.2.1 ක්ෂේත්‍ර නිලධාරින්ගේ පුහුණු වැඩසටහන්

ළමා අපයෝජන තත්ත්වයන් අවම කරමින් ළමුන්ට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරිම උදෙසා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

මෙම වැඩ සටහන් ශ්‍රී ලාංකික ළමා පරපුරේ ආරක්ෂාව හා රැකවරණය තහවුරු කිරීම පිණිස ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා ප්‍රමාණවත් දැනුමක් සහිත නිලධාරීන් පිරිසක් සේවයේ යෙදවීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් හා සහකාර නිලධාරීවරුන් සේවයේ යෙදී සිටී.

මෙම නිලධාරින්ට ක්ෂේත්‍රයේ ළමයින් සම්බන්ධව කටයුතු කිරීමේ දී පවතින දැනුම ප්‍රමාණවත් නොවීම හා නිරන්තරව යාවත්කාලීන විය යුතු බැවින් හා නිලධාරින්ගේ දැනුම, කුසලතා , ආකල්ප, ඵලදායීව මෙහෙයවීම සඳහා ද පුහුණුවීම් ලබා දීම සිදු කළ යුතුව ඇත. ඒ උදෙසා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය මගින් 2018 වසරේ දී පුහුණු වැඩ සටහන් සංවිධානය කර පවත්වන ලදී.

වැය ශීර්ෂය - 217-2-2-2401

අනුමත ප්‍රතිපාදන - රු.1,000,000.00

| පුහුණු වැඩ සටහනේ නම | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | වියදම රු. | විෂය මාතෘකා |
|---|---|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන | 26<br>28<br>27<br>26<br>28 | 2018.04.24 – 26<br>2018.05.14 - 16<br>2018.07.09 – 13<br>2018.07.10 – 16<br>2018.08.13 - 16 | 95,320.00<br>106,605.00<br>180,.040.00<br>160,210.00<br>104,757.00 | • දෙපාර්තමේන්තුගත රාජකාරී සහ තිරසර සංවර්ධනය<br>• සිද්ධි කළමනාකරණය<br>• දෙපාර්තමේන්තුගත රාජකාරී සිදු කිරීම<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය හා නව ප්‍රවණතා, දෙපාර්තමේන්තු කටයුතු<br>• ළමා සංවර්ධනය, ළමා හිමිකම් ප්‍රවර්ධනය හා ආදර්ශ ළමා ගම්මාන කටයුතු<br>• ධනාත්මක දෙමාපියභාවය |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංස්කරණ සම්මේලනය (නුවර එළිය සණස නිවාඩු නිකේතනය) | 310 | 2018.11.29 - 30 | 1,240,130.00 | |

### 2.2.2 ළමා නිවාස නිළධාරී කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන

| පුහුණු වැඩ සටහනේ නම | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | වියදම රු. | විෂය මාතෘකා |
|---|---|---|---|---|
| ළමා නිවාස නිළධාරී කාර්ය මණ්ඩල පුහුණුව | 27<br><br>23 | 2018.02.19 – 21<br><br>2018.02.26 -28 | 128,705.00<br><br>117,752.00 | • ළමුන් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් යොදා ගැනීම<br>• ළමා අරක්ෂණය සඳහා විකල්ප රැකවරණ ක්‍රම<br>• ළමුන් සමඟ කටයුතු කිරීමේදී නිලධාරීන් සතු ආකල්ප කුසලතා වර්ධනය<br>• ළමුන් සඳහා රැකවරණය දෙන සමාජ වැඩකරුවන් ලෙස කටයුතු කරන ආකාරය |
| බස්නාහිර පළාත් ස්වේච්ඡා ළමා නිවාස කළමනාකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන | 11<br><br>17 | 2018.03.19<br><br>2108.03.22 | 13,100.00<br><br>19,220.00 | • ළමුන් සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් යොදා ගැනීම<br>• ළමා අරක්ෂණය සඳහා විකල්ප රැකවරණ ක්‍රම<br>• ළමුන් සමඟ කටයුතු කිරීමේදී නිලධාරීන් සතු ආකල්ප කුසලතා වර්ධනය<br>• ළමුන් සඳහා රැකවරණය දෙන සමාජ වැඩකරුවන් ලෙස කටයුතු කරන ආකාරය |

### 2.2.3 ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි සම්පත්දායක සංචිතය

| පුහුණු වැඩ සටහන | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | පැවැත් වූ ස්ථානය | වියදම රු. |
|---|---|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී සම්පත්දායක සංචිතය සඳහා ii කණ්ඩායම තෝරා ගැනීම | සිංහල මාධ්‍ය 37<br><br>ද්‍රවිඩ මාධ්‍ය 15 | 2018.09.27 - 28 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 27,385.00 |

### 2.2.4 ළමයින් සම්බන්ධව කටයුතු කරන ඒකාබද්ධ නිලධාරී පුහුණුව

| පුහුණු වැඩ සටහන | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය | පැවැත් වූ ස්ථානය | වියදම රු. | විෂය මාතෘකා |
|---|---|---|---|---|---|
| ළමයින් සම්බන්ධව කටයුතු කරන ඒකාබද්ධ නිලධාරී පුහුණුව<br>❖ නුවර එළිය/පුත්තලම දිස්ත්‍රික්කවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්<br>❖ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරීන්<br>❖ ජාතික ළමාරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන්<br>❖ විදේශ රැකියා ප්‍රවර්ධන නිලධාරීන් | 34 | 2018.06.11 - 13 | තලාහේන අධ්‍යාපන මධ්‍යස්ථානය | 36,933.00 | • ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය<br>• සමාජ වැඩ<br>• ළමුන් සමඟ වැඩ කිරීමේදී සමාජ වැඩකරුවෙකු ලෙස<br>• සිද්ධි කළමනාකරණය හා ආරක්ෂන සැලසුම් සැකසීම |



# 03

# ගිණුම් අංශය

දෙපාර්තමේන්තු අරමුණු සාක්‍ෂාත් කර ගැනීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව රාජ්‍ය අයවැය ලේඛනය මඟින් සපයා දෙනු ලබයි. 2018 වසරේදී 217 වැය ශිර්ෂය යටතේ යටතේ ප්‍රතිපාදන සපයා ඇත .

මෙම ප්‍රතිපාදන වෙන් කිරීම වැඩසටහන් දෙකකින් සමන්විතය.

1. මෙහෙයුම් වැඩසටහන
2. සංවර්ධන වැඩසටහන

ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

## 3.1 මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන් වශයෙන් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | |
|---|---|---|---|---|
| 01. මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 1. පුනරාවර්තන වියදම් | 38,411,000.00 | 35,703,473.00 | 93% |
| | 2. මූලධන වියදම් | 899,000.00 | 890,293.00 | 99% |
| | **එකතුව** | **39,310,000.00** | **36,593,766.00** | |
| 02. සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්‍ෂක සේවා | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | |
| | 1. පුනරාවර්තන වියදම් | 232,670,000.00 | 231,266,695.00 | 99% |
| | 2. මූලධන වියදම් | 78,450,000.00 | 74,866,795.00 | 95% |
| | **එකතුව** | **311,120,000.00** | **306,133,454.00** | |

| මූල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | හැකියා වර්ධනය | | | ළමා නිවාස පුනරුත්තාපනය කිරීම/ළමා නිවාස අධීක්ෂණය / ළමා නිවාස දරුවන්ගේ | | |
| 1.මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 250,000.00 | 247,800.00 | 99 % | --- | --- | - |
| 2.සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්‍ෂක සේවා | 1,450,000.00 | 1,450,000.00 | 100 % | 75,500,000.00 | 72,046,892.00 | 95 % |
| **එකතුව** | **1,700,000.0** | **1,697,800.00** | | **75,500,000.0** | **72,046,892.0** | |

| මූල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | මූලධන වත්කම් අත්පත් කරගැනීම | | |
| 01. මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | % |
| | 240,000.00 | 233,531.00 | 97% | 409,000.00 | 408,962.00 | 99% |
| 02. සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්ෂක සේවා | 300,000.00 | 218,976.00 | 73% | 1,200,000.00 | 1,150,927.00 | 96% |
| **එකතුව** | **540,000.00** | **452,507.00** | | **1,609,000.00** | **1,559,889.00** | |

## 3.2 විගණන නිරීක්ෂණය

මූල්‍ය ප්‍රකාශනයේ අදහස් දැක්වීම යන ඡේදයේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 වන දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව නිරීක්ෂණය විය



# 04

## පරිවාස අංශය

## 4.1 හැඳින්වීම

පරිවාස සේවය යනුවෙන් අදහස් කරනුයේ ආයතනගත කිරීමක්, සිරගත කිරීමක්, වෙනත් මූල්‍යමය දඩයකට හෝ වෙනත් දණ්ඩනයකට යටත් කිරීමකින් තොරව වරදකරුවෙකු පුනරුත්ථාපනය කිරීමයි. හුදෙක් එමඟින් අපේක්ෂා කරනුයේ පුද්ගලයා ජීවත්වන පරිසරයේම ඉන්නට ඉඩහැර පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඔහුට සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් වැළකී නව ජීවිතයක් ගොඩනගා ගැනීමට අවස්ථාව ලබාදීමයි.

1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනතේ 03 වන වගන්තිය අනුව කිසියම් වරදක ස්වභාවය අනුව ද වරදකරුවාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ඔහුගේ තත්ත්වය යන කරුණු ද අධිකරණය මගින් සැලකිල්ලට ගෙන ඕනෑම පුද්ගලයෙකු වරදකරුවෙකු යැයි තීරණය කිරීමෙන් අනතුරුව ඔහුගේ කැමැත්ත ද ඇතිව ඕනෑම වරදක් සම්බන්ධයෙන් පරිවාස නියෝගයක් පැනවිය හැකිය.

මෙසේ පරිවාස භාරයට යොමු කිරීමෙන් වරදකරුට ආර්ථික හා සාමාජීය වශයෙන් ප්‍රතිලාභ හිමිවන අතරම එය අවසානයේ මුළු මහත් සමාජයටම ද ප්‍රතිලාභ ගෙන දෙන්නකි. උදාහරණයක් ලෙසට යම් පුද්ගලයෙකු කිසියම් වරදක් කොට ඔහු සිරභාරයට හෝ වෙනත් දඬුවමකට ලක් කලහොත් එය ඔහුගේ පවුලට ආර්ථික හා සාමාජීය වශයෙන් අහිතකර ලෙස බලපානු ලබයි. එසේම රටට ද එවැනි අයෙකු නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. එහෙත් එම පුද්ගලයා ජීවත්වන පරිසරය තුළ තබා කිසියම් අධීක්ෂණයට ඔහු යටත් කිරීමෙන් ඔහුගේ එදිනෙදා ජීවිතය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට ඉඩකඩ සලසා දීම තුළින් එකී පුද්ගලයාටත් රටටත් ඉන් අහිතකර තත්ත්වයක් ඇති නොවේ.එබැවින් මෙම පරිවාස සේවය ප්‍රජාපාදක පුනරුත්ථාපන ක්‍රියාවලියක් ලෙසට මුළු ලෝකයම පිළිගෙන ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පළාත් සභා වෙත පැවරී ඇතත් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම රජය යටතේ දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. තවද පරිවාස සේවය විමධ්‍යගත වුවද අදාල ප්‍රතිපත්ති හා අන පනත් සංශෝධනය කිරීම පළාත් දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය කිරීම, පළාත් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනයට කටයුතු කිරීම, පළාත් සභා වෙත තාක්ෂණික සහය ලබා දීම, පළාත් සභා යටතේ ඇති ළමා සුරකුම් මධ්‍යස්ථාන ගුණාත්මකව ඉහල නැංවීමට පියවර ගැනීම ආදිය මධ්‍යම රජයේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයකි. ඒ අනුව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් පරිවාස සේවය වැඩිදියුණු කිරීමට පසුගිය කාලය තුළ කටයුතු කරන ලදි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම යටතේ පළාත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම හා එකී ප්‍රගති සමාලෝචනය ද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ

## 4.2 පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

විවිධාකාර ගැටළු වලට බඳුන් වූ හා අපයෝජන සිදුවීමක් හෝ අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සිදුවීම හේතුවෙන් මානසිකව පීඩාවට පත්ව ඇති දැරියන් සඳහා පමණක් උපදේශනය ලබා දීම සඳහා ස්ථාපිත කර ඇති ආයතනයකි. මධ්‍යම රජය යටතේ ඇති පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් එකම ආයතනය ද මෙය වේ.

අධිකරණ නියෝග මත යොමු කරන වයස 14-18 අතර දැරියන් පළාත් පරිවාස කොමසාරිස්ගේ නිර්දේශ මත මෙම ආයතනයේ පුහුණුව සඳහා ඇතුළත් කරනු ලැබේ. මාස 06 ක කාල සීමාවක් සඳහා නේවාසික පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, දැරියන් 20 දෙනෙකු සඳහා පහසුකම් සපයා ඇත. තෝර ගැනීමේදී සමාජගත කිරීමට හැකි සහ සමාජගත කිරීමට ආසන්න (care Leavers) දරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

මෙම කාලය තුළ දැරියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව, විධිමත් අධ්‍යාපනය නොලද අය වෙනුවෙන් නොවිධිමත් අධ්‍යාපනය ලබා දීමට කටයුතු කර ඇත. ඊට අමතරව මෙම පුහුණු කාලය තුල විනෝද චාරිකා,ආගමික වැඩ සටහන් මෙන්ම යෝගී වැඩ සටහන් පවත්වනු ඇත. මේ තුළින් දරුවන්ගේ මානසික ගැටළුවලට සහනයක් වනු ඇත.

දරුවන් වෙනුවෙන් ස්ථාපන කමිටු පවත්වා එහි තීරණ පරිදි දැරියන් දෙමව්පියන් වෙත හෝ භාරකරුවන් වෙත භාර දීමට කටයුතු කර ඇත.





## 4.3 ළමා නිවාස ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම

දිවයිනේ සෑම පළාතකම පිහිටි රජයේ හා ලියාපදිංචි ස්වේච්ඡා ළමා නිවාසවල දරුවන්ගේ ආරක්ෂාව හා අවශ්‍යතාවයන් ගුණාත්මක භාවයකින් යුක්තව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යතාවයන් පලාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් විසින් හඳුනාගෙන ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනා සඳහා අවශ්‍ය සහාය ලබා දීම මෙමගින් සිදු කෙරේ.

වාර්ෂිකව මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන හඳුනාගත් සංවර්ධන වැඩ සටහන් සම්බන්ධව යෝජනා සම්බන්ධයෙන් විමසා බැලීමකින් අනතුරුව එහි අවශ්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුගත මුදල සම්පූර්ණයෙන් හෝ ඇස්තමේන්තුගත මුදලින් කොටසක් පළාත් කොමසාරිස්වරුන් වෙත යොමු කරනු ලැබේ.

ඒ අනුව අදාළ ව්‍යාපාති නිසි පරිදි අවසන් කිරීමෙන් අනතුරුව අදාල බිල්පත් සහ වියදම් වාර්තා සහිතව අදාල ප්‍රගතිය ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කෙරේ.

ඒ අනුව 2018 වර්ෂයේ දී මෙම වැය ශීර්ෂය යටතේ දිවයින පුරා පිහිටි ළමා නිවාස සහ පරත්ත ළමා පුහුණු උපදේශණ සේවා ජාතික මධ්‍යස්ථානය නවීකරණය සහ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 7,135,730.01 ක මුදලක් වැයකරණ ලදී.

| පළාත | වැඩසටහන | ලබා දුන් මුදල (රු.) |
|---|---|---|
| උතුරු මැද | බෝසත් බාලක ළමා නිවාසයේ ගේට්ටුව ඉදි කිරිම 11 අදියර | 484,566.75 |
| | සාලියපුර කාන්තා රැඳවුමේ ජල ටැංකිය සැදිම | 181,625.85 |
| | මිත්‍ර ළමා සංවර්ධන මධ්‍යස්ථානය ජලය රැස්කර ගැනිමට ටැංකිය සකසා ගැනිම | 221,413.61 |
| | සරණ ළමා නිවාසයේ අප ජලය ගලා යාමට කානු පද්ධතිය සැදිම | 230,022.26 |
| | මඩාටුගම සහතික කළ පාසැල සදහා ජෙනරේටරයක් මිලදි ගැනිම | 37,524.00 |
| | **එකතුව** | **1,155,152.47** |
| | බිබිල සෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නාන ස්ථානය/කානු පද්ධතිය සැදිම | 900,000.00 |
| | සුජාතා සෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ රෙදි සේදිම හා වියලිමේ ස්ථානය සකස් කිරිම | 820,907.60 |

| | | |
|---|---|---|
| ඌව | යසෝධරා බාලිකා රුදවුමේ ප්‍රධාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරිම<br><br>කැප්පෙටිපොල සුරක්ෂා බාලක රුදවුමේ වහලය අලුත්වැඩියා කිරිම<br><br>අඹේගොඩ සිරිසගබෝ ළමා නිවාසයේ වැසිකිළි අළුත් වැඩියා කිරිම | 190,504.61<br><br>286,709.31<br><br>426,386.50 |
| | එකතුව | **2,624,508.02** |
| වයඹ | මීගහකොටුව බාලිකා නිවාසයේ තීන්ත ආලේප කිරිම<br><br>මුදිත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නිවාසයේ තීන්ත ආලේප කිරිම<br><br>ශ්‍රේබියල් ට්‍රස්ට් ළමා නිවාසයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ සිවිලිම ගැසිම සඳහා | 220,064.00<br><br>220,000.00<br><br>1,185,254.30 |
| | එකතුව | **1,625,318.30** |
| නැගෙනහිර | ළමා නිවාස 03 සඳහා තීන්ත ආලේප කිරිම (ශ්‍රී ෂන්මුගා, හසනාත්, රේවත ළ.ස.ම.) | 817,798.00 |
| | එකතුව | **817,798.00** |
| මධ්‍යම | ගම්පොල ශා.ජෝශප් ළමා නිවාසයට උපකරණ මිලදි ගැනිම | 88,265.00 |
| | එකතුව | **88,265.00** |
| සබරගමුව | කෑගල්ල ශා.ජෝන් ළමා නිවාසයේ ළිඳ හා අබලන් කාණු පද්ධතිය අළුත්වැඩියා කිරිම | 315,000.00 |
| | එකතුව | **315,000.00** |
| ජාතික උපදේශන හා පුහුණු මධ්‍යස්ථානය | ගොඩනැගිලි හා අනෙකුත් අලුත්වැඩියා කටයුතු කිරිම | 509,688.22 |
| | එකතුව | **509,688.22** |
| මුළු මුදල | | **7,135,730.01** |

## 4.4 ආයතනගත දරුවන්ගේ කුසලතා වර්ධනය

පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානයේ දරුවන්ට හා සෑම පළාතකම ළමා නිවාසගත දරුවන්ගේ සහජ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වැඩසටහනකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ළමා නිවාසවල දරුදැරියන් වෙත සෑම පළාතකම දරුවන් නියෝජනය වන පරිදි කුසලතා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීමට සුදුසු යෝජනා එවන ලෙස දන්වන ලදී. එම එවන ලද යෝජනා අතරින් දරුවන්ට සුදුසු වැඩ සටහන් තෝරා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන ලදි. ඒ අනුව නිවාසගත ළමුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා රු.1,475,910.00 ක මුදලක් වැයකරන ලදී.

තවද, ළමා නිවාස ගත දරුවන් සමාජගත වන අවස්ථාව වන විට වෘත්තීයක නිරත කරවීමට සුදුසුකම් ලබා දීම අරමුණු කර ගෙන විවිධ වෘත්තීය පුහුණු ලබා දීම වෙනුවෙන් පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කර ඇති යෝජනා වලට අනුව රු.1,612,132.82ක ප්‍රතිපාදන මුදලක් ලබා දීමට කටයුතු කර ඇත.

| පළාත | වැඩසටහන | ලබා දුන් මුදල |
|---|---|---|
| උතුරු මැද | මඩාටුගම සහතික කළ පාසැලේ වෘත්තීය පුහුණු අංශයේ අඩුපාඩු සපුරා ගැනිම | 500,786.00 |
| | යෙහෙළි උපදේශන අංශයේ වෘත්තීය පුහුණු කට්ටල ගැනිම | 434,880.00 |
| | ළමා නිවාස ගත ළමුන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන් 03 | 360,000.00 |
| | මඩාටුගම සහතික කළ පාසැලේ ළමුන් ගේ | |
| | • තුරුණු හඬ ව්‍යාපෘතිය | 135,500.00 |
| | • පැහැසර ව්‍යාපෘතිය | 253,170.00 |
| | • ශක්තීන් පුබුදුවාලමු ව්‍යාපෘතිය | 77,000.00 |
| | ළමා නිවාසගත ළමුන්ගේ ආකල්ප කුසලතා හා සංවර්ධන වැඩසටහන් (පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) | 15,300.00 |
| | **එකතුව** | **1,776,636.00** |


| | | |
|---|---|---|
| ඌව | කැප්පෙටිපොල සහතික කළ පාසලේ ළමුන්ගේ විදුලි වෘත්තීය පුහුණුවට අදාල භාණ්ඩ ගැනිම | 267,725.00 |
| | **එකතුව** | **267,725.00** |
| නැගෙනහිර | ළමා නිවාස ගත ළමුන්ගේ කුසලතා සංවර්ධන<br><br>ළමුන් 02 වෘත්තීය පුහුණු වැඩසටහන | 300,000.00<br><br>75,000.00 |
| | **එකතුව** | **375,000.00** |
| සබරගමුව | ගෝවින්දසාමි කාසිර් ළමයා ගේ වායුසමීකරණ පාඨමාලාව | 34,000.00 |
| | **එකතුව** | **34,000.00** |
| බස්නාහිර | ළමා නිවාසවල ළමුන්ගේ දැනුම මිනුම ධාරිතා වැඩසටහන් (ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)<br><br>ළමා නිවාස ළමුන් සහ ළමා සමාජ ළමුන් අතර අත්දැකීම් හුවමාරුව (කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)<br><br>ළමා නිවාස ළමුන් සඳහා ගීත රසවින්දන වැඩසටහන (කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)<br>ළමානිවාසගත දරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 100,000.00<br><br>112,000.00<br><br>16,000.00<br><br>79,300.00 |
| | **එකතුව** | **307,300.00** |
| දකුණ | ළමා නිවාසගත ළමුන්ගේ නායකත්ව , පෞර්ෂත්ව කුසලතා වැඩසටහන් (හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) | 27,640.00 |
| | **එකතුව** | **27,640.00** |
| ජාතික උපදේශන හා පුහුණු මධ්‍යස්ථානය | ළමුන්ගේ නායකත්ව , පෞර්ෂත්ව කුසලතා වැඩසටහන් | **299,741.82** |
| **මුළු මුදල** | | **3,088,042.82** |

## 4.5 ළමා නිවාස අධීක්ෂණය

මේ යටතේ ළමා නිවාසයට අවශ්‍ය ස්ථාවර වත්කම් සැපයීම හා අවශ්‍ය පහසුකම් සැලසීම, හඳුනාගත් ළමුන් සමාජගත කිරීම, ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණු කිරීම් කටයුතු සිදු කර ඇත. එමෙන්ම ළමා නිවාස අධීක්ෂණය ද මෙමගින් කරන ලද කාර්යයකි. 2018 වර්ෂය තුළ මේ සඳහා රු. 7,306,359.35 ක මුදලක් වැය කර ඇත.

| පළාත | වැඩසටහන | ලබා දුන් මුදල |
|---|---|---|
| උතුරු මැද | ළමා නිවාස අධීක්ෂණය<br>ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණුව<br>ළමුන් 02 සමාජගත කිරිම (විවාහය සදහා)<br>මඩාටුගම සහතික කළ පාසැලේ ළමුන් 07 සමාජගත කිරිම | 61,500.00<br>111,000.00<br>28,000.00<br>750,565.00 |
| | **එකතුව** | **951,065.00** |
| වයඹ | ළමා නිවාස 06 සදහා භාණ්ඩ ගැනිම<br>ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණුව<br>ළමුන් තිදෙනෙක් සමාජගත කිරිම | 264,050.00<br>82,800.00<br>149,125.02 |
| | **එකතුව** | **495,975.02** |
| නැගෙනහිර | ළමා නිවාස කාර්ය මණ්ඩල පුහුණුව<br>ළමුන් සමාජගත කිරිම (ළමුන් 25 සදහා)<br>ළමුන් සමාජගත කිරිම (ළමුන්09 සදහා)<br>පරිවාස නිලධාරින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 130,000.00<br>1,350,000.00<br>750,000.00<br>147,200.00 |
| | **එකතුව** | **2,377,200.00** |
| සබරගමුව | රඹුක්කන බෝධිරාජ ළමා ගම්මාන ළමා නිවාසයේ ඉදි කිරිම 1 අදියර<br>කැගල්ල ශා.ජෝන් ළමා නිවාසය සදහා අත්‍යවශ්‍ය උපකරණ මිලදි ගැනිම<br>පරිවාස නිලධාරින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | 1,692,049.40<br>121,960.00<br>200,000.00 |
| | **එකතුව** | **2,014,009.40** |
| මධ්‍යම | පරිවාස නිලධාරින් ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන<br>මෙන්කැප් ළමා නිවාසයේ වැසිකිළි 02 ක් ඉදි කිරිම.<br>ළමුන් දෙදෙනෙක් සමාජගත කිරිම<br>ශා.ප්‍රැන්සිස් ළමා නිවාසයේ වැසිකිළිපද්ධතිය සදහා ශක්තිමත් වහලක් ඉදි කිරිම | 129,075.00<br>392,866.68<br>74,045.00<br>316,056.25 |
| | **එකතුව** | **912,042.93** |

| | | |
|---|---|---|
| උතුර | පරිවාස නිලධාරින් ගේ ධාරිතා සංවර්ධන පුහුණුවැඩසටහන | 229,950.00 |
| | එකතුව | **229,950.00** |
| පළාත් කොමසාරිස්වරුන්ගේ | රැස් වීම් | 47,340.00 |
| | එකතුව | **47,340.00** |
| ළමා නිවාස නිළධාරී කාර්ය | මණ්ඩල පුහුණු වැඩසටහන | **278,777.00** |
| **මුළු මුදල** | | **7,306,359.35** |




## 4.6 තැනැත්තන් වෙළඳාම පිළිබඳව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරීන් දැනුවත් කිරීම

තැනැත්තන් වෙළඳාම (Human Trafficking) ශ්‍රී ලංකාව තුළත් ඉන් පිටතත් බහුලව සිදු වුවත් දණ්ඩ නීති සංග්‍රහයේ නීති ප්‍රතිපාදන මත මෙම තැනැත්තන් වෙලඳාමට අදාළ සිද්ධි හඳුනා ගැනීම නිසි ලෙස සිදු නොවන බවට විටින් විට වාර්තා විය.

ඇමරිකානු එක්සත් ජනපදයේ “රාජ්‍ය දෙපාර්තමේන්තුව” විසින් 2018 වසරේදී නිකුත් කර ඇති තැනැත්තන් වෙළඳාම සම්බන්ධ වාර්ථාවට අනුව (Trafficking in persons Report – 2018) ශ්‍රී ලංකාව තැනැත්තන් වෙළඳාමට අදාළ සිද්ධි දණ්ඩ නීති සංග්‍රහයේ 360(C) වගන්තියට අනුව නිසි ලෙස හඳුනා ගැනිම සිදු නොකරන බවට වාර්ථා කර ඇත. ඉහත තත්ත්වයද සැලකිල්ලට ගෙන දැනට සකස් කොට ඇති තැනැත්තන් වෙළඳාම පිලිබඳ ක්‍රියාකාරි සැලැස්මට (2015-2019) අනුව සිද්ධි හඳුනා ගැනීම හා වැලැක්වීම අරමුණු කොට ගෙන පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරින් 198 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පැවැත්විමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.





## 4.7 අධිකරණවල සිට ළමා සුරැකුම් මධ්‍යස්ථාන වෙත ළමුන් ප්‍රවාහනය

නීතිය ඉදිරියේ වරදකරුවන් වූ ළමුන්, ළමා සැකකරුවන් මෙන්ම විවිධාකාර අපයෝජනයන්ට ලක්වීමෙන් වින්දිතභාවයට පත්වන ළමුන් අධිකරණ ඉදිරියට පමුණුවනු ලැබීමෙන් අනතුරුව එම ළමුන් උදෙසා යුක්තිය පසිඳලීමේ ක්‍රියාපටිපාටියේදි එම දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා ඇතැම් අවස්ථාවලදී තාවකාලිකව ඔවුන් අධිකරණ නියෝග මත ළමයා සුරැකුම් මධ්‍යස්ථානවල (Safety House) රඳවා තැබීමට සිදුවේ. මෙම වින්දිත හා ළමා සැකකරුවන් වැඩිහිටි වරදකරුවන් සමඟ ප්‍රවාහනය කිරිම නිසා ඔවුන් ද්විතික අපයෝජනයට ලක්වන බවට අනාවරණය වීම හේතුවෙන් ළමුන් සඳහා වෙන් වූ “ළමා මිතුරු ප්‍රවාහන සේවයක” අවශ්‍යතාවය දීර්ඝ කාලයක සිට සිට සාකච්ඡා කරන ලදී.

ළමුන් වෙනුවෙන් කටයුතු කරනු ලබන ආමාත්‍යාංශ හා පැවැත්වූ දීර්ඝ කාලීන සාකච්ඡා වලින් අනතුරුව ළමුන් ප්‍රවාහනය සඳහා වෙන් වූ ප්‍රවාහන ක්‍රමවේදයක අවශ්‍යතාවය පිළිබඳව එකඟතාවයකට පැමිණීමට හැකිව තිබේ. ඒ අනුව එහි ප්‍රථම පියවර ලෙසට පළාත් 05ක් සඳහා වෑන් රථ 5ක් ලබාදීමට 2018 වසරේදී පියවර ගන්නා ලදි. ඉතිරි පළාත් 04 සඳහා ඉදිරියේදී වාහන වෙන් කිරිමට නියමිතය. එමෙන්ම සුදුසු කාර්ය මණ්ඩල බඳවා ගැනිමට මේ වන විට කටයුතු කරමින් සිටින අතර ඉන් අනතුරුව සැම පළාතකම අධිකරණවල සිට ළමා සුරැකුම් මධ්‍යස්ථාන වෙත ළමුන් ප්‍රවාහනය කිරීමට හැකි විධිමත් “ළමා මිතුරු ප්‍රවාහන ක්‍රමවේදයක්” (child Friendly Transportation System) සකස් කිරීමට සැලසුම් කර ඇත.





## 4.8 පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු යටතේ සේවය කරනු ලබන පරිවාස නිලධාරීන් පුහුණු කිරීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විමධ්‍යගත වීමෙන් අනතුරුව ළමුන්ට අදාළව ප්‍රතිපත්ති සකස් කිරීම, පළාත් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය ඇති කිරීම, පළාත් අතර සම්බන්ධීකරණය ඇති කිරීම මෙන්ම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවල යටිතල පහසුකම් ඇති කිරීම වැනි කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් පරිවාස විෂය ක්ෂේත්‍රය මුල් කර ගෙන ඉටු කරමින් සිටින රාජකාරීවලින් කොටසකි.

ඒ අනුව නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය ඇති කිරීම සඳහා සෑම වර්ෂයකම පාහේ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. එසේම උතුරු හා නැගෙනහිර පළාත්වල නිලධාරීන් 70 දෙනෙකු සඳහා 2018 වසරේදී පුහුණු වැඩසටහන් 2ක් උතුරු නැගෙනහිර පළාත් දෙකේදී මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය මත පවත්වන ලදී.





## 4.9 දරුකමට හදාවඩා ගැනීම

1941 අංක 24 දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනත යටතේ හදාවඩා ගැනීමට යෝජිත දරුවන්ගේ නීත්‍යානුකූල භාරකරු ලෙස ක්‍රියා කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මෙම කාර්යභාරය දේශීය හා විදේශීය වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙයින් දේශීය හදාවඩා ගැනීම් පිළිබඳ රාජකාරි පළාත් කොමසාරිස් විසින් ඉටු කරනු ලබන අතර විදේශීය හදාවඩා ගැනීම් පිළිබඳ රාජකාරි කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ උපත ලබා එහෙත් වර්තමානයේ නොයෙක් විදේශ රටවල පුරවැසි භාවය ලබා සිටින්නවුන්, ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල ද්විත්ව පුරවැසිභාවය හිමි අය හා තාවකාලිකව වෙනත් රටවල ජීවත් වන පුද්ගලයන් ද දරුවන් හදාවඩා ගැනීම සඳහා සිය ඉල්ලුම්පත් මධ්‍යම රජයේ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි. එම ඉල්ලුම්කරුවන් දරුවන් රටින් බැහැරට ගෙන යන බැවින් ඔවුන් විදේශ හදාවඩා ගැනීමේ නීතිරීති අනුගමනය කළයුතු වේ.

තවද විදේශ රටවල ජීවත් වන ඇතැම් ඉල්ලුම්කරුවන් තම පවුලේ ඥාති දරුවන් හදාවඩා ගැනීමට ඉදිරිපත් වන අවස්ථා ඇති අතරම ඔවුන්ට ද විදේශ හදාවඩා ගැනීමේ උපදෙස් පිළිපැදීමට සිදුවේ. එසේම විදේශිකයන්ද ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදා වඩා ගැනීමට සිය ඉල්ලුම්පත්‍ර පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. අන්තර් ජාතික හේග් සම්මුතියේ හා ළමුන් දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනතේ නීති ප්‍රතිපාදන මත එම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරනු ලැබේ. දේශීය ඉල්ලුම්කරුවන් නොමැති ළමුන් විදේශ හදා වඩා ගැනීම සඳහා යොමු කරනු ලැබේ

## 4.10 විදේශ හදාවඩා ගැනීම් සඳහා වෙන් කළ දරුවන් - 2018

| අංක | විදේශිය රට | විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් විසින් හදාවඩා ගැනීමට ගත් දරුවන් සංඛ්‍යාව | විදේශ හදාවඩා ගැනීම් | හදාවඩා ගැනීමට දුන් මුළු දරුවන් ගණන |
|---|---|---|---|---|
| 01 | ජර්මනිය | 02 | 01 | 03 |
| 02 | කැනඩාව | - | 01 | 01 |
| 03 | ප්‍රංශය | 02 | 04 | 06 |
| 04 | ස්වීඩනය | 01 | - | 01 |
| 05 | ඇමරිකාව | - | 01 | 01 |
| | එකතුව | 05 | 07 | 12 |



# 05

# සංවර්ධන අංශය

## 5.1 හැඳින්වීම

ළමයා කෙරෙහි විශේෂ රැකවරණය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය

- 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙහි
- 1959 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන් විසින් සම්මත කරනු ලැබූ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි
- 1976 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1976 ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1991 ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි
- ළමයින්ගේ සුභසාධනය පිළිබඳ ප්‍රවේදිතාවක් ඇත්තාවූ විශේෂිත අනුයෝජිතායතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථා සහ අදාළ සාධන පත්‍රවල පිළිගනු ලැබ ඇත්තා වූ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි

ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිගන්නා නීති සහ ප්‍රතිපත්ති සඳහා විධි විධාන සැලසිය යුතු හෙයින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කර ඇත. එකී ප්‍රඥප්තියෙහි විධි විධාන ආවරණය වන පරිද්දෙන් දෙපාර්තමේන්තුව විසින් පහත දක්වා ඇති ආකාරයට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. ජීවත්වීමට හා සංවර්ධනයට ඇති අයිතිවාසිකම් සහතික කිරිම යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය
    - අධ්‍යාපන ආධාර ලබා දීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය
    - නැණ දිරිය අධ්‍යාපන ආධාර ලබා දීම
    - හදිසි විපත් / වෛද්‍යාධාර / නිවුන් දරු ආධාර ක්‍රම
    - සෙනෙහස ආධාර ක්‍රමය
2. ළමා සහභාගීත්වය තහවුරු කිරීම යටතේ සිදු කරන ලද වැඩසටහන්
    - ළමා සමාජ හා ළමා සභා ස්ථාපිත කිරීම
    - ලෝක ළමා දිනය පිළිබඳ වැඩසටහන්
3. ප්‍රජා මූලික ළමාරක්ෂණය යටතේ සිදු කරන ලද වැඩසටහන්
    - ළමා මිතුරු ආදර්ශ ගම්මාන පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම
    - ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳ මෙහෙයුම් කමිටු පැවැත්වීම

- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

4. විකල්ප රැකවරණය යටතේ සිදු කරන ලද වැඩසටහන්

- අපයෝජනයට පත් දරුවන් පුනරුත්ථාපනය කිරීම
- ආයතනගත ළමුන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම
- ආයතනගත ළමුන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

## 5.2 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම උදෙසා අධ්‍යාපන අධාර ලබා දීම

සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිවාසිකමක් ඇති අතරම ළමා සංවර්ධනයේ දී එය ඉතා වැදගත් සාධකයකි. ළමා කාලය තුළ අධ්‍යාපන අවස්ථාව අහිමි වුවහොත් ළමුන්ගේ අනාගතය අඳුරු විය හැකිය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය අතරමග නතර කරන ළමුන් නිසා ළමා ශ්‍රමිකයන්, ළමා මව්වරුන් බිහිවීම හා විවිධ අපයෝජන වලට ළමුන් ලක්වන අවස්ථා බහුල වී ඇත. දෙමාපියන් අහිමිවීම, දෙමාපියන්ගේ නොදැනුවත්කම, නොසැළකිල්ල, මව විදේශගතවීම, ආර්ථික දුෂ්කරතා ආදී විවිධ කරුණු මත ළමුන්ගේ පාසැල් අධ්‍යාපනය අතරමග නතරවීම සිදුවනු ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම තුළින් සදාචාරවත් දරු පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙහිදි ප්‍රවේශ 2 ක් යටතේ දරුවන්ට උපකාර කරනු ලැබේ.

- පාසල් අධ්‍යාපනය ලබන වයසේ පසු වුවත් ආර්ථික දුෂ්කරතා නිසා අතරමග අධ්‍යාපනය නවතා දමා ඇති හෝ නතර විය හැකි දරුවන්
- විවිධ හේතුන් මත කඩින් කඩ පාසල් යන දරුවන් ය.


පාසල් නොයන දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන ඔවුන්ගේ පාසල් නොයාමට හේතුව සොයා බලා ඊට අවශ්‍ය කටයුතු සිදු කර ඔවුන්ව පාසල් ගත කිරීම හා පසුවිපරම මෙමඟින් සිදු කරන ලදී.

මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කරන ලදී

- පාසල් උපකරණ ලබාදී ඔවුන් ශක්තිමත් කිරීම.
- අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම ගැන දරුවන්, ගුරුවරුන්, දෙමාපියන් සඳහා දැනුවත් කිරීම වැඩසටහන් කිරීම.
- විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් නිලධාරීන් අතර දරුවාට යහපත් වන පරිදි මනා සම්බන්ධීකරණයක් ගොඩ නැගීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

## 2018 වර්ෂයේදී අධ්‍යාපන ආධාර ලබා දීම

| දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල |
|---|---|---|
| මාතර | 96 | 96,000.00 |
| හම්බන්තොට | 72 | 72,000.00 |
| ගාල්ල | 114 | 114,000.00 |
| කොළඹ | 78 | 78,000.00 |
| කළුතර | 104 | 104,000.00 |
| ගම්පහ | 78 | 78,000.00 |
| කෑගල්ල | 66 | 66,000.00 |
| රත්නපුර | 105 | 108,475.00 |
| බදුල්ල | 96 | 96,000.00 |
| මොණරාගල | 66 | 66,000.00 |
| කුරුණෑගල | 180 | 180,000.00 |
| මාතලේ | 60 | 60,000.00 |
| නුවරඑළිය | 30 | 30,000.00 |
| පුත්තලම | 111 | 111,000.00 |
| අම්පාර | 120 | 120,000.00 |
| පොළොන්නරුව | 42 | 42,000.00 |
| අනුරාධපුරය | 132 | 132,000.00 |
| මහනුවර | 123 | 127,625.00 |
| ත්‍රිකුණාමලය | 60 | 60,000.00 |
| යාපනය | 84 | 84,000.00 |
| මඩකලපුව | 84 | 84,000.00 |
| වවුනියාව | 24 | 24,000.00 |
| කිලිනොච්චිය | 24 | 24,000.00 |
| මුලතිව් | 18 | 18,000.00 |
| මන්නාරම | 30 | 30,000.00 |
| **එකතුව** | **1997** | **2,005,100.00** |




## 5.3 කැපකරු දෙගුරු වැඩසටහන

තවදුරටත් දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා උදෙසා සහයෝගය දෙනු ලබන වැඩසටහනක් ලෙස කැපකරු දෙගුරු වැඩසටහන හඳුන්වා දිය හැකිය. මෙය මාසිකව ලබා දෙනු ලබන අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. සුවිශේෂී අධ්‍යාපනික දක්ෂතා ඇති ආර්ථික වශයෙන් අගහිඟකම් මැද ජීවත්වන පාසල් දරුවන් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වේ. මොවුන්ගේ තෝරා ගැනීම හා යොමු කිරීම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හරහා සිදු කරනු ලබන අතර, මාසයකට රු. 500/-ක මුදලක් එක් දරුවෙකු වෙනුවෙන් ලබා දීමට කටයුතු කෙරේ.

**2018 වර්ෂයේ කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර ගෙවීම්**

| | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල |
|---|---|---|---|
| 1. | මාතර | 124 | 792,000.00 |
| 2. | හම්බන්තොට | 138 | 762,000.00 |
| 3. | ගාල්ල | 150 | 840,000.00 |
| 4. | කොළඹ | 95 | 525,000.00 |
| 5. | කළුතර | | 516,000.00 |
| 6. | ගම්පහ | 111 | 615,000.00 |
| 7. | කෑගල්ල | 116 | 618,000.00 |
| 8. | රත්නපුර | | 606,000.00 |
| 9. | බදුල්ල | | 885,000.00 |
| 10. | මොණරාගල | | 555,000.00 |
| 11. | කුරුණෑගල | 244 | 1,344,000.00 |
| 12. | මාතලේ | | 435,000.00 |
| 13. | නුවරඑළිය | 36 | 162,000 .00 |
| 14. | පුත්තලම | 48 | 273,000.00 |
| 15. | අම්පාර | 50 | 222,000.00 |
| 16. | පොළොන්නරුව | 19 | 102,000.00 |
| 17. | අනුරාධපුරය | 171 | 948,000.00 |
| 18. | මහනුවර | 184 | 1,044,000.00 |
| 19. | ත්‍රිකුණාමලය | 12 | 72,000.00 |
| 20. | යාපනය | 85 | 504,000.00 |
| 21. | මඩකලපුව | 36 | 189,000.00 |
| 22. | වවුනියාව | 2 | 12,000.00 |
| 23. | කිලිනොච්චිය | 1 | 6,000.00 |
| 24. | මුලතිවු | 1 | 6,000.00 |
| 25. | මන්නාරම | 1 | 6,000.00 |
| | එකතුව | 2008 | **12,039,000.00** |




## 5.4 නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය

නැණ දිරිය වැඩසටහන සඳහා ද පෞද්ගලික අංශයේ මූල්‍ය දායකත්වය මත මෙම දෙපාර්තමේන්තුවේ කළමණාකරණ මණ්ඩලයක් මඟින් විවිධ හේතු මත අධ්‍යාපනය අහිමි වීමේ අවදානමට පත් වී ඇති දරුවන් සඳහා මාසික ශිෂ්‍යත්වයක් පිරිනැමේ. මෙම වැඩසටහන ද සෙවණ සරණ කැපකරු මා පිය ක්‍රමය යටතේ උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙමගින් එක් දරුවකුට මසකට රු. 1000/- ත් රු. 2000/- ත් අතර මුදලක් අනුග්‍රාහකයාගේ කැමැත්ත අනුව ලබා දෙනු ඇත.

**නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය**

| වර්ෂය | වැඩ සටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| **2018** | නැණ දිරිය අධ්‍යාපන ආධාර වැඩ සටහන | 63 | 791,077.47 |


## 5.5 නිවුන් දරු ආධාර

අඩු ආදායම්ලාභී පවුල්වල නිවුන් දරුවන්ගේ සෞඛ්‍ය, පෝෂණය හා අනෙකුත් සුභසාධන කටයුතු වෙනුවෙන් මෙන්ම එම දරුවන් අවදානම් තත්වයන්ගෙන් ආරක්‍ෂා කර ගැනීම පිණිස ලබා දෙන ආධාර ක්‍රමයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහිදී සිදුවේ.

මේ යටතේ දරුවන් දෙදෙනෙකු සඳහා රු.7500/- ක්ද තුන් දෙනෙකු වෙනුවෙන් රු.15,000/- ක් ද සිව් දෙනෙකු සඳහා රු.20,000/- ක් ද පස් දෙනෙකු වෙනුවෙන් රු.25,000/- ක් ද වශයෙන් මුදල් ගෙවීම් සිදු කරයි.

සෑම ඉල්ලුම් කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට වැඩි පිරිසකට මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව උදා වී ඇත.

| | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල |
|---|---|---|---|
| 1. | මාතර | 21 | 157,500.00 |
| 2. | හම්බන්තොට | 8 | 60,000.00 |
| 3. | ගාල්ල | 6 | 52,500.00 |
| 4. | කොළඹ | 7 | 60,000.00 |
| 5. | කළුතර | 3 | 22,500.00 |
| 6. | ගම්පහ | 6 | 56,000.00 |
| 7. | කෑගල්ල | 15 | 127,500.00 |
| 8. | රත්නපුර | 26 | 195,000.00 |
| 9. | බදුල්ල | 11 | 97,500.00 |
| 10. | මොණරාගල | 16 | 120,000.00 |
| 11. | කුරුණෑගල | 27 | 210,000.00 |
| 12. | මාතලේ | 22 | 187,500.00 |
| 13. | නුවරඑළිය | 19 | 157,500.00 |
| 14. | පුත්තලම | 5 | 37,500.00 |
| 15. | අම්පාර | 14 | 105,000.00 |
| 16. | පොළොන්නරුව | 0 | - |
| 17. | අනුරාධපුරය | 9 | 67,500.00 |
| 18. | මහනුවර | 15 | 112,500.00 |
| 19. | ත්‍රිකුණාමලය | 5 | 37,500.00 |
| 20. | යාපනය | 19 | 142,500.00 |
| 21. | මඩකලපුව | 20 | 150,000.00 |
| 22. | වවුනියාව | 7 | 52,500.00 |
| 23. | කිලිනොච්චිය | 2 | 15,000.00 |
| 24. | මුලතිව් | 1 | 15,000.00 |
| 25. | මන්නාරම | 2 | 15,000.00 |
| | **එකතුව** | **286** | **2,253,500.00** |




## 5.6 වෛද්‍ය ආධාර


අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ ගැටළු සඳහා සහන සැපයීම වෙනුවෙන් මෙම ආධාර ක්‍රමය ක්‍රියාත්මක වේ. එසේම ආබාධිත දරුවන් වෙනුවෙන් ද උපකාර කිරීම මෙහිදී සිදු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහිදී සිදු වේ.

මේ යටතේ වෛද්‍ය ප්‍රතිකාර, සැත්කම්, පෝෂණ කටයුතු, ශාරීරික දුර්වලතා වෙනුවෙන් භාවිතා කරන උපකරණ සඳහා ආධාර සැපයීම සිදු කරනු ලබයි. ප්‍රතිකාර හා පෝෂණ කටයුතු වෙනුවෙන් රු.5000/- මුදලක් ද, සැත්කම් සඳහා රු.10,000/- ක මුදලක් ද, උපකරණ සඳහා ඒවායේ මිල ගණන් අනුව විවිධ ප්‍රමාණයේ මුදල් ගෙවීම ද සිදු වේ. මෙම ගෙවීම් ප්‍රමාණයන් එම දරුවන්ගේ පවුල් වල විවිධ ස්වභාවයන් හා ඔවුන් මුහුණ පා ඇති දුෂ්කරතාවයන් මත වෙනස් වීමට ද පුළුවන.

සෑම ඉල්ලුම්කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට පමණ මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව ලැබී ඇත

## 2018 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෛද්‍යාධාර ගෙවීම් සිදුකළ ආකාරය

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල | ළමුන් ගණන |
|---|---|---|---|
| 1 | මාතර | 240,000.00 | 42 |
| 2 | හම්බන්තොට | 55,000.00 | 9 |
| 3 | ගාල්ල | 175,000.00 | 34 |
| 4 | කොළඹ | 25,000.00 | 4 |
| 5 | කළුතර | 20,000.00 | 3 |
| 6 | ගම්පහ | 140,000.00 | 27 |
| 7 | කෑගල්ල | 20,000.00 | 4 |
| 8 | රත්නපුර | 120,000.00 | 21 |
| 9 | බදුල්ල | 65,000.00 | 13 |
| 10 | මොණරාගල | 155,000.00 | 30 |
| 11 | කුරුණෑගල | 275,000.00 | 49 |
| 12 | මාතලේ | 40,000.00 | 8 |
| 13 | නුවරඑළිය | 75,000.00 | 14 |
| 14 | පුත්තලම | 35,000.00 | 7 |
| 15 | අම්පාර | 225,000.00 | 43 |
| 16 | පොළොන්නරු | 5,000.00 | 1 |
| 17 | අනුරාධපුරය | 75,000 .00 | 13 |
| 18 | මහනුවර | 210,000.00 | 38 |
| 19 | ත්‍රිකුණාමලය | 115,000.00 | 22 |
| 20 | යාපනය | 250,000.00 | 46 |
| 21 | මඩකලපුව | 150,000.00 | 30 |
| 22 | වවුනියාව | 10,000.00 | 2 |
| 23 | කිලිනොච්චිය | 25,000.00 | 5 |
| 24 | මුලතිවු | 30,000 .00 | 6 |
| 25 | මන්නාරම | 65,000.00 | 12 |
| | **Total** | 2,600,000.00 | 483 |




## 5.7 හදිසි විපත් ආධාර

හදිසියේ ඇති වන විපත් නිසා පවුල් වල අසරණ වන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා ලබා දෙන ආධාර ක්‍රමයකි. ක්ෂණිකව පරිසරයේ ඇතිවන ගංවතුර, සුලි සුළං, නාය යෑම්, නිවාස ගිනි ගැනීම්, වැනි තත්වයන් මත දුෂ්කරතාවයන්ට පත් වන දරුවන්ගේ සුභ සාධනය සැලසිම මෙහිදී සිදු වේ. එපමණක් ද නොව පවුල් තුළ දෙමව්පියන් මිය යෑම, දරුවන් අත්හැර දමා යෑම, දෙමව්පියන් හදිසි අනතුරු වලට රෝගාබාධ වලට ගොදුරු වීම, විදේශ ගතව නැවත නොපැමිණීම, දරුවන් තාවකාලික භාරකරුවන් අතට පත් වීම, එම භාරකරුවන් ශාරීරික හා මානසික දුර්වල අය වීම වැනි හේතුන් මත අසරණ වන දරුවන්ට පිහිට වීමට ද මෙම ආධාර ක්‍රමය උපකාරී වේ.

යම් ව්‍යසනකාරි තත්වයක දී දරුවන්ගේ පාසල් උපකරණ විනාශ වි ඇත්නම් ඒ වෙනුවෙන් එක් පවුලක් සඳහා රු. 5000/- ක ආධාරයක් ලබා දේ. එසේ වුව ද ඒ ඒ අවස්ථාවන්හි ඇති වන හානිදායක තත්වයේ ප්‍රබලතාවය මත ලබා දෙන ආධාර මුදල වෙනස් වීමට පුළුවන. කුමන හෝ ව්‍යසනකාරී තත්වයක දී වුවත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට දායකවීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහි දී සිදු වේ.

**2018 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් හදිසිවිපත් ගෙවීම් සිදුකළ ආකාරය**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල | ළමුන් ගණන |
|---|---|---|---|
| 1 | මාතර | - | |
| 2 | හම්බන්තොට | 50000.00 | 10 |
| 3 | ගාල්ල | 35000.00 | 7 |
| 4 | කොළඹ | - | - |
| 5 | කළුතර | - | - |
| 6 | ගම්පහ | 10000.00 | 2 |
| 7 | කෑගල්ල | 5000.00 | 1 |
| 8 | රත්නපුර | 30000.00 | 6 |
| 9 | බදුල්ල | 35000.00 | 7 |
| 10 | මොණරාගල | - | - |
| 11 | කුරුණෑගල | 127000.00 | 44 |
| 12 | මාතලේ | - | - |
| 13 | නුවරඑළිය | - | - |
| 14 | පුත්තලම | 85000.00 | 4058 |
| 15 | අම්පාර | 40000.00 | 8 |
| 16 | පොළොන්නරු | 15000.00 | 2 |
| 17 | අනුරාධපුරය | 25000.00 | 5 |
| 18 | මහනුවර | 88000.00 | 17 |
| 19 | ත්‍රිකුණාමලය | - | - |
| 20 | යාපනය | - | - |
| 21 | මඩකලපුව | - | - |
| 22 | වවුනියාව | 10000.00 | 2 |
| 23 | කිලිනොච්චිය | 10000.00 | 2 |
| 24 | මුලතිවු | 10000.00 | 2 |
| 25 | මන්නාරම | 25000.00 | 5 |
| | එකතුව | 600000.00 | 4178 |




## 5.8 සෙනෙහස ඉතිරි කිරීමේ ගිණුම


සුනාමි ව්‍යසනයෙන් දෙමව්පියන් දෙදෙනාම අහිමි අවු.18ට අඩු දරුවන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. 2006 වර්ෂයේ මෙම වැඩසටහන ආරම්භ වූ අතර එහි දී ළමුන් 689 දෙනෙකු ඇතුළත් විය. සෑම මසකම අවු.18 සම්පූර්ණ වන ළමුන් මෙම වැඩසටහනින් ඉවත් වේ.

මෙම දෙපාර්තමේන්තුව මහජන බැංකු මූලස්ථානය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. සෑම මාසයකම අදාළ ළමුන් වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව මඟින් මහජන බැංකුව වෙත මුදල් (චෙක්පත් මඟින්) යැවීම සිදු කරයි.

වයස අවු.18 සම්පූර්ණ වන ළමුන් පිළිබඳව බැංකුව මඟින් දෙපාර්තමේන්තුව වෙත මාසිකව දැනුම් දෙනු ලබයි. බැංකුව මඟින් අදාළ ළමුන් වෙත මුදල් නිදහස් කර එම තොරතුරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම සිදු වේ.

**2018 වර්ෂයේ සෙනෙහස ගිණුමේ මුදල් වැය වූ ආකාරය**

| අනු අංකය | මාසය | ළමුන් සංඛ්‍යාව | වැය වූ මුදල ( රු. ) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 45 | 67,500.00 |
| 02 | පෙබරවාරි | 45 | 67,500.00 |
| 03 | මාර්තු | 45 | 67,500.00 |
| 04 | අප්‍රේල් | 45 | 66,000.00 |
| 05 | මැයි | 45 | 63,000.00 |
| 06 | ජූනි | 45 | 61,500.00 |
| 07 | ජූලි | 45 | 61,500.00 |
| 08 | අගෝස්තු | 45 | 61,500.00 |
| 09 | සැප්තැම්බර් | 45 | 61,500.00 |
| 10 | ඔක්තෝම්බර් | 45 | 60,000.00 |
| 11 | නොවැම්බර් | 45 | 57,000.00 |
| 12 | දෙසැම්බර් | 45 | 57,000.00 |
| | එකතුව | | 751,500.00 |




## 5.9 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය

මෙම වැඩසටහන තුළින් ආර්ථික අපහසුතා මැද අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ඉගෙනුම් අවශ්‍යතා සපයා ගැනීමට අවශ්‍ය පරිදි මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙනු ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය කැපකරු මාපියන් ගෙනි.


| වර්ෂය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| **2018** | සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය | 07 | 126,077.47 |

## 5.10 ළමා සමාජ හා ළමා සභා ව්‍යාපෘතිය

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන්ව ඇති පරිදි 12,13,14 යන වගන්ති මගින් ආවරණය වන ළමයින්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කරමින් ළමයින් බලගැන්වීමේ ප්‍රධාන අරමුණින් යුතුව 2007 වර්ෂයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ළමා සමාජ පිහිටුවන ලදි. මෙසේ පිහිටුවා ගන්නා ලද ළමා සමාජ තුළින් තීන්දු තීරණ ගැනීමට මෙහෙයවීමට හා බලගැන්වීමට, දරුවන්ගේ මතය ප්‍රකාශ කිරීම හා දරුවන්ගේ සංවර්ධනයට, සාරධර්ම හා කුසලතා වර්ධනයට අදාළ විවිධ  වැඩසටහන් රාශියක් සෑම ප්‍රාදේශීය ලේකම්  කොට්ඨාශයකම ක්‍රියාත්මක කර ඇත.

ප්‍රාදේශීය ලේකම්  කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති ළමා සමාජ ඒකරාශී කරගනිමින් ප්‍රාදේශීය ළමා සභා ද, ප්‍රාදේශීය ළමා සභාවේ නිලධාරී මණ්ඩලයේ එකතුවෙන් දිස්ත්‍රික් ළමා සභා ද ,දිස්ත්‍රික් ළමා සභාවල එකතුවෙන් ජාතික ළමා සභාවක් ද ස්ථාපිත කර ඇත.

## ළමා සමාජ ළමා සභා ව්‍යුහය




2018 වර්ෂයේදී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් එකතු කර ගැනීම , ප්‍රවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන්කරනු ලැබූ අතර එහි ප්‍රතිපලයක් ලෙස දිස්ත්‍රික් සභාවට විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සහභාගී වී තිබීම දැකිය හැකි විය.

මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පහත සඳහන් වැඩසටහන් සේව්ද චිල්ඩ්‍රන් ආයතනය විසින් ලබා දී ඇති ළමයින් සඳහා වන සමාජ ආරක්ෂණ අරමුදල මගින් ක්‍රියාත්මක කර ඇත.

### 1. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ළමා සභා ශක්තිමත් කිරීම

ප්‍රාදේශීය/දිස්ත්‍රික් ළමා සභාවට අයත් ළමුන් රැස්කර වර්ෂයේ ක්‍රියාත්මක වන වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ප්‍රාදේශීය/දිස්ත්‍රික් ළමා සභාව රැස් කිරීම ත්‍රෛමාසිකව සිදු වේ. එබැවින් ප්‍රාදේශිය සහ දිස්ත්‍රික් ළමා සභාවල ක්‍රියාත්මකභාවය වැඩිදියුණුවන ආකාරයට ඒවා පහසුකරණය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම පිණිස එක් ප්‍රාදේශිය/දිස්ත්‍රික් කාර්යාලයක් වෙනුවෙන් රු.5,000/-ක මුදලක් ලබා දී ඇත.

### 2. පහසුකරුවන් පුහුණු කිරීම

ළමා සභා ව්‍යුහය තුළ දරුවන්ගේ සහභාගීත්වය පිළිබඳ පර්යේෂණයේ නිර්දේශයන්ට අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම ළමා සමාජ ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ළමා සමාජ පහසුකරුවන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති අතර මෙම බඳවාගත් පහසුකරුවන් ළමා සමාජ වැඩපිළිවෙළ තුළ දිගටම රඳවා තබා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මේ යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහාම (නිලධාරීන් දෙදෙනෙකු සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහා රුපියල් 10,000 ක් ) රුපියල් 5,000 ක මුදලක් ලබා දී ඇත.

### 3. ජාතික ළමා සභාව හා නිලවරණය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් සෑම දෙවසරකට වරක්ම පවත්වන දරුවන්ගේ සහභාගීත්ව අයිතිය සහතික කිරීමේ උපරිම සංවිධාන ව්‍යුහය වන ජාතික ළමා සභාව හා නිලවරණය 2018 වර්ෂයේදී ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

මෙම වැඩසටහන සඳහා දිස්ත්‍රික් 25ක දිස්ත්‍රික් ළමා සභා දරුවන් හා දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින්/සහකාරවරුන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/සහකාරවරුන් හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහභාගී විය. එමෙන්ම ප්‍රථම වරට විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හා වතු ආශ්‍රිතව වෙසෙන දරුවන්ද ජාතික ළමා සභාව සඳහා මෙවර සහභාගි කර ගැනිණි.

වැඩසටහනට ඇතුලත් වූ අංග

1.ශාරීරික සුවතා වැඩසටහන
2. ළමා චිත්‍රපටයක් දර්ශනය කිරීම
3. ආදි ළමා සමාජ සාමාජිකයින් ඇගයීම
4. ආකල්ප සංවර්ධනය පිළිබඳ මනෝ විද්‍යාත්මක දේශනය
5. Talent Show
6.ආපදා කළමනාකරණය සම්බන්ධ දැනුවත් කිරීමේ දේශනය
7. නිලවරණය - දරුවන්ගේ ඡන්දයෙන් සියළු තනතුරු තෝරා පත්කරගනු ලැබේ.
8.රසවින්දනාත්මක වැඩසටහන
9. නව ජාතික ළමා සභාවේ පළමු සැසිය
10.සහතිකපත් ප්‍රධානය





### 4. බිත්ති සිතුවම් නිර්මාණය

දරුවන් සුරකීම පිළිබඳ තේමා පාඨයන් හා දර්ශන ඇතුලත් බිත්ති සිතුවම් (Wall Painting) නාගරික ප්‍රදේශවල ප්‍රදර්ශනය කිරිමේ කටයුත්ත දරුවන් සුරකිමු ජනපති ජාතික වැඩසටහනේ 1: 11 වගන්තිය මඟින් අප දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

ඒ අනුව සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම තෝරාගත් එක් පාසලක් මේ සඳහා යොදා ගත් අතර එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ සඳහන් දරුවන්ගේ අයිතිවාසිකම් සුරැකිම හා දරුවන්ට වන හිංසනයන් පිටුදැකිම පිළිබිඹු වන අයුරින් බිත්ති සිතුවම්  පාසල් පවුරු තුළ නිර්මාණය කිරීම මෙහිදී සිදු විය. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්ගෙන් අනුමැතිය ලබා ලබාගන්නා ලදී. මේ සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට රු. 10,000/= ක ප්‍රතිපාදන ලබා දෙනු ලැබීය.





**5. ළමුන් සඳහා ජීවිතාරක්ෂක ප්‍රථමාධාර ක්‍රම හඳුන්වා දීම**

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පදනම් කර ගනිමින් ළමුන්ගේ ජිවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීම, සංවර්ධනය වීමේ  අයිතිය හා සහභාගීත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.  ඒ අනුව ජීවිතාරක්ෂක ප්‍රථමාධාර වැඩසටහන ළමුන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කිරීමට දරුවන් බලගැන්විම සඳහා වන එක් වැඩසටහනකි. දරුවන් තුළ සහකම්නය ඇති කිරීම, පරිත්‍යාගශීලී බව වර්ධනය කිරීම, අවස්ථානෝචිතව බුද්ධිමත්ව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙන්ම හදිසි ආපදා වලදී කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට හුරු කිරීම හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරිණි. මෙහිදී දරුවන් හට හදිසි ආපදාවකදී කටයුතු කළ යුතු ආකාරය හා ශාරීරික හානියකදී ලබාදිය යුතු ප්‍රථමාධාර, ස්වයංවිනය ඇති කර ගැනීම තුළ තවත් කෙනෙකුට සිදුවන හානිය අවම කරන අයුරු, ස්වයං ආරක්ෂාව සලසා ගත යුතු ආකාරය පිළීබඳව දැනුවත් භාවය ලබාදෙන ලදී. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා රු.6000ක ප්‍රතිපාදන මුදලක් ලබා දෙන ලදී.






**2018 ළමා සභා හා ළමා සමාජ වෙනුවෙන් ලබා දුන් ප්‍රතිපාදන**

| # | දිස්ත්‍රික්කය | ළමා සභා/සමාජ රැස්වීම් | පහසුකරුවන්ගේ වැඩසටහන | බිත්ති සිතුවම් නිර්මාණය | ප්‍රථමාධාර වැඩසටහන |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 70,000.00 | 80,000.00 | 130,000.00 | 78,000.00 |
| 2 | ගම්පහ | 70,000.00 | 105,000.00 | 130,000.00 | 78,000.00 |
| 3 | කළුතර | 75,000.00 | 85,000.00 | 140,000.00 | 84,000.00 |
| 4 | මාතලේ | 55,000.00 | 60,000.00 | 90,000.00 | 60,000.00 |
| 5 | නුවර එළිය | 30,000.00 | 40,000.00 | 50,000.00 | 30,000.00 |
| 6 | මහනුවර | 105,000.00 | 140,000.00 | 200,000.00 | 120,000.00 |
| 7 | මාතර | 85,000.00 | 85,000.00 | 160,000.00 | 96,000.00 |
| 8 | ගාල්ල | 100,000.00 | 105,000.00 | 190,000.00 | 114,000.00 |
| 9 | හම්බන්තොට | 65,000.00 | 75,000.00 | 120,000.00 | 72,000.00 |
| 10 | කුරුණෑගල | 155,000.00 | 215,000.00 | 300,000.00 | 180,000.00 |
| 11 | පුත්තලම | 85,000.00 | 80,000.00 | 160,000.00 | 96,000.00 |
| 12 | අනුරාධපුර | 115,000.00 | 115,000.00 | 220,000.00 | 132,000.00 |
| 13 | පොළොන්නරුව | 40,000.00 | 45,000.00 | 70,000.00 | 42,000.00 |
| 14 | බදුල්ල | 80,000.00 | 80,000.00 | 150,000.00 | 90,000.00 |
| 15 | මොණරාගල | 60,000.00 | 55,000.00 | 110,000.00 | 66,000.00 |
| 16 | රත්නපුර | 90,000.00 | 85,000.00 | 170,000.00 | 102,000.00 |
| 17 | කෑගල්ල | 60,000.00 | 70,000.00 | 110,000.00 | 66,000.00 |
| 18 | යාපනය | 75,000.00 | 80,000.00 | 140,000.00 | 84,000.00 |
| 19 | කිලිනොච්චිය | 25,000.00 | 20,000.00 | 40,000.00 | 24,000.00 |
| 20 | මන්නාරම | 30,000.00 | 25,000.00 | 50,000.00 | 30,000.00 |
| 21 | වවුනියා | 25,000.00 | 20,000.00 | 40,000.00 | 24,000.00 |
| 22 | මුලතිවු | 20,000.00 | 15,000.00 | 50,000.00 | 30,000.00 |
| 23 | මන්නාරම | 75,000.00 | 70,000.00 | 140,000.00 | 84,000.00 |
| 24 | අම්පාර | 105,000.00 | 100,000.00 | 200,000.00 | 120,000.00 |
| 25 | ත්‍රිකුණාමලය | 55,000.00 | 50,000.00 | 100,000.00 | 60,000.00 |
| | **Total** | **1,750,000.00** | **1,900,000.00** | **3,260,000.00** | **1,962,000.00** |

## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා සමාජ ගණන

| | දිස්ත්‍රික්කය | 2018 ලියාපදිංචි ළමා | ලියාපදිංචි මුළු ළමා සමාජ |
|---|---|---|---|
| 1 | කොළඹ | 45 | 262 |
| 2 | කළුතර | 35 | 228 |
| 3 | ගම්පහ | 41 | 346 |
| 4 | මහනුවර | 73 | 518 |
| 5 | මාතලේ | 45 | 210 |
| 6 | නුවර එළිය | 14 | 138 |
| 7 | ගාල්ල | 148 | 394 |
| 8 | මාතර | 19 | 214 |
| 9 | හම්බන්තොට | 18 | 226 |
| 10 | රත්නපුර | 40 | 257 |
| 11 | කෑගල්ල | 44 | 223 |
| 12 | අනුරාධපුර | 57 | 312 |
| 13 | පොලොන්නරුව | 14 | 80 |
| 14 | පුත්තලම | 48 | 262 |
| 15 | කුරුණෑගල | 53 | 640 |
| 16 | බදුල්ල | 40 | 185 |
| 17 | මොණරාගල | 3 | 167 |
| 18 | ත්‍රිකුණාමලය | | 78 |
| 19 | අම්පාර | 15 | 146 |
| 20 | මඩකලපුව | 12 | 97 |
| 21 | යාපනය | 42 | 137 |
| 22 | කිලිනොච්චි | 22 | 80 |
| 23 | මන්නාරම | 5 | 35 |
| 24 | මුලතිව් | | 30 |
| 25 | වව්නියාව | 29 | 67 |
| | එකතුව | **862** | **5332** |

## 2015 සිට 2018 දක්වා ළමා සමාජ ලියාපදිංචි වී ඇති අයුරු



## 5.11 වීදි දරු සුභසාධන වැඩසටහන

ළමා අපයෝජනය අවම කර සුරක්ෂිත ළමා පරපුරක් ඇති කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී වීදි දරුවන්ගේ ආරක්ෂාව හා සුබ සාධනය සඳහා වැඩසටහන් පැවැත්වීම ඉතා වැදගත් වේ. මේ යටතේ කොළඹ, ගම්පහ, මහනුවර හා මොණරාගල දිස්ත්‍රික්කවල බහුලව ජීවත්වන වීදි දරුවන් පිළිබඳව සුබ සාධන වැඩ සටහන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සිදු කර ඇති අතර මේ තුළින් වීදි දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සුරක්ෂිත කිරීම, ළමුන්ගේ නිර්මාණශීලීත්වය, සැඟවුණු කුසලතා, තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරමින් පෞරුෂ හා නායකත්ව කුසලතා සංවර්ධනය සඳහා අතදීමට හැකි වී ඇත.

**වීදි දරු සුබ සාධන වැඩසටහන යටතේ 2018 වර්ෂයේ සිදු කළ කාර්යයන් හා ලබා දුන් ප්‍රතිපාදන**

| දිස්ත්‍රික්කය | වීදි දරුවන් සඳහා සුභ සාධක හා පුහුණු වැඩසටහන් පැවැත්වීම | වීදි දරුවන්ගේ පවුල් නගා සිටුවීම | වීදි දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා ගැනීම |
|---|---|---|---|
| මහනුවර | 25,000 | 125,000 | 600,000 |
| කොළඹ | 266,280 | 125,000 | 600,000 |
| මොණරාගල | - | 320,000 | - |
| එකතුව | **291,280** | **570,000** | **1,200,000** |

## 5.12 ළමා මිතුරු ආදර්ශ ගම්මාන වැඩසටහන

දරුවන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ළමා මිතුරු ආදර්ශ ගම්මාන වැඩ සටහන ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ආදර්ශ ගම්මාන, දරුවන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නිර්මාණශීලි ලෙස ගොඩනගන ලද වැඩ සටහන් උපයෝගී කර ගනිමින්, ප්‍රජාවගේ ක්‍රියාකාරී මැදිහත්වීම සහිතව ක්‍රියාත්මක වේ. ළමා උපදේශණ (Child Advisory Team) කමිටු නිලධාරීන්ගේ මැදිහත්වීම ද මෙම යාන්ත්‍රණය සවිමත් කිරීමට ඉවහල් වී ඇත.

දෙපාර්තමේන්තුව වසින් දරුවන් උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් මෙම ගම්මාන තුළ සෘජුව ම ක්‍රියාත්මක කළ හැකිය. දරුවන්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කිරීම අරමුණු කර ගනිමින් සිදු කරනු ලබන ළමා සමාජ වැඩ සටහන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් වැනි වැඩ සටහන් නිර්මාණශීලී ලෙස මෙම ගම්මාන තුළ සිදු කිරීමට මනා හැකියාවන් ඇත.

ආදර්ශ ළමා ගම්මාන හඳුනා ගැනීම සිදු කරනු ලබන්නේ ගමෙහි දරුවන් හට පවතින අවදානම් මට්ටම් අනුව වන අතර ප්‍රජාව ගේ ආධාරය සහ මැදිහත්වීම තුළ දැනට ගම තුළ පවතින ක්‍රියා පිළිවෙල වෙනස් කිරීමේ ක්‍රියාවලියන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ක්‍රියාවලිය එක් එක් ගමෙහි පවතින

ක්‍රියාපිළිවෙලට සුදුසු වන ලෙසින් සිදු කෙරේ. මෙම ක්‍රමවේදය තුළින් ප්‍රජාවගේ තීරණ හා අවශ්‍යතා මත පදනම් වූ විසඳුම් ලබා දීමට හැකියාව ලැබේ.

මෙම වසරේ දී මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම් සඳහා වන වැඩ සටහන් නිර්මාණශීලි ලෙස ආදර්ශ ගම්මානය තුළ සිදු කරන ලදී. මෙම කාර්ය සඳහා සෑම ළමා හිමිකම් ප්‍රවර්ධන/සහකාර නිලධාරියෙකුටම රු.3000/- බැගින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

එසේ ප්‍රාදේශීය කොට්ඨාශ 331 කට ප්‍රතිපාදන යැවූ අතර "දරුවන් හදාවඩා ගැනීමේ යහපත් ක්‍රමවේද" පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 හි වාසය කරන දෙමාපියන්ව මේ වන විට දැනුවත් කර ඇත.

තෝරාගත් ආදර්ශ ගම්මාන 10 කට ඒකාබද්ධ ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් අවදානම් තත්ත්වයන් අවම කිරීමට දරුවන් නඟා සිටුවීමට එම දරුවන්ගේ පවුල් බල ගැන්වීමට සකස් කරන ලද ව්‍යාපෘතිවලට ප්‍රතිපාදන යවන ලදී.එම වැඩසටහන් ද ඉතා සාර්ථකව 2018 වර්ෂය තුළ අවසන් කරන ලදී.

## 5.13 ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු වැඩසටහන

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා ප්‍රජා පාදක සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීමත්, ශක්තිමත් කිරීමත් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කර ගෙන යනු ලබන කටයුතත්තකි. ඒ අනුව ළමා අයිතිවාසිකම් ප්‍රජාව අතරට රැගෙන යාම, ළමුන් විෂයෙහි ඇති ගැටළු සඳහා සාධනීය මැදිහත් වීමක් ලබා දීම, එම කාර්යයන් රජය ලෙස මෙහෙයුම් ක්‍රියාවලියට ඇතුළත් වීම වෙනුවෙන් ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටු ක්‍රියාවලිය පවත්වා ගෙන යනු ලබයි.

මෙම වැඩ සටහන ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන සෑම පරිපාලන තලයකදීම නිලධාරීන් හා ප්‍රජාව සම්බන්ධ වෙමින් පවත්වා ගෙන යනු ලබන කමිටු ව්‍යුහයක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ දී සෑම වසමකටම ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු පිහිටුවා ඇත. ඒ සඳහා ව්‍යවස්ථාපිත කරුණු හා විධිමත් භාවයක් ඇති කිරීම උදෙසා ඉතා විධිමත් මාර්ගෝපදේශනයක් ද හඳුන්වා දී ඇත.එමෙන්ම ප්‍රාදේශීය මාර්ගෝපදේශනයක් ද හඳුන්වා දී ඇත. එමෙන්ම ප්‍රාදේශීය ලේකම්ගේ සහභාගීත්වයෙන් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව, පළාත් ළමා සංවර්ධන කමිටුව, හා ජාතික මෙහෙයුම් කමිටුව ලෙස මෙම කමිටු ක්‍රියාදාමය ව්‍යාප්ත වී ඇත. මෙම වැඩ සටහන සඳහා ඉතාම ශක්තිමත් පදනමක් සකස් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ද අනුමත කර ගෙන ඇති අතර ඊට සමගාමීව 01/2018 අංකයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මගින් සියළු රාජ්‍ය පාර්ශවකරුවන් වෙත චක්‍රලේඛයක් ද නිකුත් කර ඇත. මෙහි දී ඒ ඒ කමිටු තලයන් හි ව්‍යුහය, කාර්යභාරය ඉතා සුවිශේෂි ලෙස හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාවලිය යටතේ දිවයින පුරා ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු 7000කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇති අතර, 331 ක් වූ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව

දිස්ත්‍රික් ලේකම්ගේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන අතර, දිසත්‍රික් 25 ආවරණය වන පරිදි එම කමිටුව ව්‍යුහය ස්ථාපනය වී ඇත. 01/2018 චක්‍රලේඛය අනුව පළාත් ළමා සංවර්ධන කමිටුව ක්‍රියාත්මක වන අතර මේ වන විට දකුණු පළාත්, මධ්‍යම, නැගෙණහිර පළාත් වල කමිටු පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතී. 2018 වර්ෂය තුළදී මධ්‍යම පළාත් කමිටු දෙක හා උතුරු මැද පළාත් කමිටු දෙක බැගින් වූ මුළු පළාත් කමිටු හතරක් සඳහා රුපියල් 22,000 ක මුදලක් මුදලක් වැයකර ඇත. එසේම ප්‍රාදේශීය කමිටු සඳහා රුපියල් 2,482,000 ක මුදලක් වැය කරන ලදී.

**ජාතික මෙහෙයුම් කමිටුව**

ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තියේ 40 වන වගන්තිය ප්‍රාකාරව 2017 මැයි 27 වන දින නිකුත් කරන ලද අමප/17/1952/740/010 අංක දරණ කැබිනට් පත්‍රිකාව අනුව ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව පිහිටුවා ඇත.

මෙහි සභාපතීත්වය කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් දරන අතර සම්බන්ධීකරණය පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් සිදු කරනු ලබයි. මෙම කමිටුවට අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද නිලධාරීන් හය දෙනෙකු ඇතුලත් වේ. එසේම දරුවන්ගේ කටයුතු වෙනුවෙන් ඍජුව හා වක්‍රව සම්බන්ධවන ආයතනවල ආයතන ප්‍රධානීන් හෝ නම් කරන ලද නිලධාරීන් කමිටුවෙහි සාමාජිකත්වය දරයි.

ජාතික කමිටුව ඉතා සක්‍රීය මට්ටමක පවතින අතර 2018 වසර තුළදී ජාතික කමිටු රැස්වීමක් හා ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ දත්ත පද්ධතිය සම්බන්ධයෙන් නිලධාරීන් පුහුණු කිරීම සඳහා වූ වැඩසටනක්ද පවත්වන ලදී.ඒ සඳහා රුපියල් 79,000 ක් වැයකරන ලදී.

## 5.14 දැනුවත් කිරීමේ වැඩසටහන

සමාජය තුළ විෂමාකාර ගැටළුවලට මුහුණ දෙන දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධව විවිධ ක්‍රියාකාරකම් මගින් දරුවන් සවිබල ගැන්වීම මෙන්ම සමාජයේ විවිධ කොටස් දැනුවත් කරයි. ප්‍රදේශීය මට්ටමෙන් මෙන්ම දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් දරුවන් සඳහා බලපාන ගැටළු හඳුනා ගනිමින්, තම ගැටළු අවම කිරීම සඳහා දරුවන්, දෙමාපියන්, ගුරුවරුන් මෙන්ම ග්‍රාමීය ජනතාවට අවශ්‍ය දැනුම ලබා දෙයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සේවය කරන නිලධාරීන් විසින් ඔවුන්ගේ කොට්ඨාශයට අදාළව පවතින ගැටළු පිළිබඳව විවිධ ව්‍යාපෘතීන් සකස් කර අප වෙත යොමු කරනු ලැබේ. එම ව්‍යාපෘතීන්ට අදාළව මෙන්ම දිස්ත්‍රික් ව්‍යාපෘතීන්ට අදාළව දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන මුදල් ලබා දෙනු ලැබේ.ඒ අනුව 2018 වර්ෂය සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා රු.2,345,000 ක මුදලක් වැය කරන ලදී.

## 5.15 ලෝක ළමා දිනය

සෑම වර්ෂයකම ඔක්තෝම්බර් 01 දිනයට යෙදෙන ලෝක ළමා දිනය සැමරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම 2018 වර්ෂයේ ලෝක ළමා දින ජාතික උත්සවය "දිරියෙන් පෙරමුණට යන්න - ළමා කැළට සවිය දෙන්න"යන තේමාව යටතේ කොළඹ අරලියගහ මන්දිරයේදී ළමුන්ගේ සංස්කෘතික අංග ,විශේෂ දේශන එක්කරමින් ඉතා උත්කර්ෂවත්ව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව පවත්වන ලදී. එදින කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාසැල් ළමයින් සහ ළමා නිවාසගත ළමුන් 2000 ක් පමණ සහභාගී කරවන ලදී.

විශ්ව ළමා දිනය මුල්කරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 351 ක පමණ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් / ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් විවිධ වැඩසටහන් ඔක්තෝම්බර් මාසය පුරා පවත්වන ලදී.ඒ සඳහා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට රු.5,000/- බැගින් රු.1,765,000 මුදලක් යවන ලදී.






## 5.16 ආරක්ෂණ සැලසුම් සකස් කිරීම

අවදානම් තත්ත්වයේ පසුවන දරුවන් සඳහා දිගු කාලීනව ආරක්ෂාව සහතික කිරීමේ වැඩ පිළිවෙල ආරක්ෂණ සැලසුම් සකස් කිරීමයි. ළමා ආරක්ෂාව සහතික කිරීමේ ශිල්පීය ක්‍රමවේදයක් ලෙස මෙහි අවශ්‍යතාව මතු වන්නේ 2011 වර්ෂයේ දී දීප ව්‍යාප්තව කරන ලද අවදානම් සහිත ළමුන් හඳුනා ගැනීම පිළිබඳ වූ සමීක්ෂණය තුළින් විශාල ළමුන් සංඛ්‍යාවක් හඳුනා ගැනීමට ලැබීම හේතුවෙනි.

මේ ආකාරයට හඳුනා ගන්නා ලද දරුවන්ගේ අවදානම් තත්වයන් විවිධ විය. ඔවුන්ගේ අවදානම් තත්ත්වයනට අනුව එම අවදානම් තත්ත්වය අහෝසි කර ආරක්ෂාව සහතික කිරීම සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සිදු කරයි. එය කෙටි කාලීනව මෙන්ම වසර කීපයක් පුරා දිගු කාලීනවද ක්‍රියාත්මක කිරීමට සිදුවන අතර ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් විසින් පසු විපරම් කටයුතු සිදු කරනු ලබයි.


මෙම ආරක්ෂණ සැලසුම් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම ඇතුළු සියළු කටයුතු වලදී වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන් ගේ සහය ද ලබා ගනු ලැබේ. ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ දී තනි පුද්ගලයකුට වඩා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම මේ තුළින් අවධාරණය කර ඇත.

මෙම ආරක්ෂණ සැළසුම් සකස් කිරීම තුළින් දරුවාගේ ආරක්ෂාව සහ සංවර්ධනය තහවුරුවන අතරම පවුල නගා සිටුවීම ද සිදුවෙයි. විශේෂයෙන් දරුවන්ගේ පෝෂණය හා සංවර්ධනයට අවශ්‍ය පවුලේ ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම් වර්ධනය මෙන්ම අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීම සඳහා ද අවශ්‍ය පහසුකම් සපයා දීමට මේ තුළින් හැකියාව ලැබී ඇත.

**2018 වර්ෂයේ ආරක්ෂණ සැළසුම් සකස් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කළ ආකාරය පහත පරිදි වේ**

| අනු අංකය | දිස්ත්‍රික්කය | මූල්‍ය වියදම (රු) | සකස් කරන ආරක්ෂණ සැළසුම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කොළඹ | 1,128,128.00 | 118 |
| 02 | කළුතර | 1,864,270.00 | 124 |
| 03 | ගම්පහ | 911,758.00 | 106 |
| 04 | ගාල්ල | 1,489,151.00 | 131 |
| 05 | මාතර | 1,236,455.00 | 112 |
| 06 | හම්බන්තොට | 2,672,827.00 | 131 |
| 07 | බදුල්ල | 1,797,877.00 | 194 |
| 08 | මොණරාගල | 613,865.00 | 118 |
| 09 | කෑගල්ල | 1,235,473.00 | 175 |
| 10 | රත්නපුර | 2,663,203.99 | 216 |
| 11 | මහනුවර | 1,612,063.50 | 318 |

| | | | |
|---|---|---|---|
| 12 | නුවරඑළිය | 383,498.00 | 59 |
| 13 | මාතලේ | 1,397,206.00 | 136 |
| 14 | කුරුණෑගල | 3,008,224.00 | 486 |
| 15 | පුත්තලම | 1,489,49000 | 130 |
| 16 | අනුරාධපුරය | 1,643,274.00 | 140 |
| 17 | පොළොන්නරුව | 462,384.00 | 55 |
| 18 | අම්පාර | 1,300,525.00 | 62 |
| 19 | ත්‍රිකුණාමලය | 1,391,149.00 | 82 |
| 20 | මඩකලපුව | 2,747,226.00 | 100 |
| 21 | යාපනය | 697,016.12 | 165 |
| 22 | මන්නාරම | 808,800.00 | 64 |
| 23 | වවුනියාව | 1,105,600.00 | 63 |
| 24 | මුලතිව් | 195,700.00 | 44 |
| 25 | කිලිනොච්චි | 1,211,800 | 64 |
| | එකතුව | 35,066,963.61 | 2735 |




## 5.17 ළමා මූලික පර්යේෂණ (Child Led Research)

ළමයින් විමසිලිමත්ය. තාර්කික මෙන්ම සහකම්පිත විශ්ලේෂණයන් ඔවුන් තුළ බොහෝ විට දැකගත හැක. දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමත් ඒවා උල්ලංඝණය වූ විට එහි යථා ස්වරූපය තුළ දරුවන් හිංසනයට පත්වන ආකාරයත් සැබවින්ම අත්දකින්නේ දරුවන්මය. එමනිසා දරුවන් අරඹයා ඇති ගැටළු සහ ඒවාට නිසි විසඳුම් සොයා ගැනීමටත් හැකි වන්නේ ඔවුනටමය. ළමා මූලික පර්යේෂණ වැඩසටහන ඒ සඳහා අවස්ථාව ලබාදෙයි. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් දිස්ත්‍රික් ළමා සභා වැඩසටහන ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහනෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිය දිස්ත්‍රික්කය තුළ දරුවන් කෙරෙහි බලපාන්නා වූ ඍණාත්මක තත්ත්වයක් පිළිබඳ අධ්‍යනයක් කොට එයට විසඳුම් ඔවුන් විසින්ම යෝජනා කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය

මැදිහත්වීම ශක්තිමත් කිරීමයි. සාක්ෂි පදනම් කොටගත් ප්‍රවේශයන් හඳුනා ගැනීමත් ඒ සඳහා දරුවන් යොමු කරමින් ඔවුනගේ දැනුම වර්ධනය කිරීමත් මෙම වැඩසටහනින් දරුවන් ලබා ගන්නා සාධනීය අත්දැකීම් අතර වෙයි. පර්යේෂණ යන්න දරුවන් අතර ඉතා ප්‍රචලිත නොවූවද මෙම වැඩසටහන තුළින් දරුවන්ගේ උනන්දුව සහ උත්සාහයත් සිය හිතමිතුරන්ගේ සුබ සාධනය උදෙසා මැදිහත්විය හැකිවීමත් ඔවුන් මෙම වැඩසටහනට ඇති රුචිකත්වය මොනවට කියාපායි. කෙසේ වෙතත් 2017 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙමින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙම වඩසටහනෙහි දෙවන පියවර 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව දිස්ත්‍රික් 12 ක සහ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකත් ලෙස පූර්ණ වශයෙන් ළමා මූලික පර්යේෂණ 13 සිදු කිරීමට හැකිවිය. එමෙන්ම 2017 වර්ෂයෙදි සිදු කරන ලද පර්යේෂණයන්ගෙන් අනාවරණය කරගත් ගැටළු සඳහා යෝජනා 5ක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව 2018 වර්ෂයේ දි මෙම වැඩසටහන යටතේ රු. 13,59747.00 ක මුදලක් වැය කරන ලදි.

## 5.18 ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන (Child Centric Disaster Risk Reduction)

ශ්‍රී ලංකාව ආපදා අවදානම් කලාපීය රටක් ලෙස හඳුනාගෙන ඇති අතර මෑත ඉතිහාසය තුළ ශ්‍රී ලංකීය සමාජයට විවිධ වූ ස්වභාවික ආපදා තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුවිය. ඉන්දියන් සාගරය තුළ ඉතා කුඩා දිවයිනක් ලෙස පිහිටා ඇති ශ්‍රී ලංකාවෙහි දේශගුණික සහ කාළගුණික විපර්යාසයට ප්‍රධාන වශයෙන් නිරිත දිග සහ ඊසාන දිග මොසම් වර්ෂාවන් හේතු වේ. අධික වර්ෂාව හේතුවෙන් හටගන්නා වූ ගංවතුර, නාය යෑම්, ජල ගැලීම්, මෙන්ම නියගය, සුළි සුළං සහ වෙනත් උවදුරු ද වසර මුළුල්ලෙහිම දක්නට ලැබේ. දරුවන් මෙම ආපදා අවදානමෙන් මිදීම උදෙසා ශක්තිමත් කිරීම කාලීන අවශ්‍යතාවයකි. වර්ථමානයේ ශක්තිමත් වන දරුවා අනාගත සමාජයම ශක්තිමත් කිරීමට වෙරදරයි. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමා කේන්ද්‍රීය ආපදා අවදානම් අවමකරණ වැඩසටහන හඳුන්වා දෙනු ලබන්නේ මෙම පසුබිම පදනම් කොට ගෙනය. දරුවන් විසින් ආපදා අවදානම අවම කිරීමේ ක්‍රමවේදයන් හඳුනා ගනිමින් ක්‍රියාත්මක වීමත් ආපදා අවස්ථාවන්හී දරුවන් ඒ සඳහා ශක්තිමත් කිරීමත් ආපදා අවදානම් කළමනාකරණයේදි ළමා මූලික ප්‍රවේශයන් හඳුන්වා දීමත් මෙම වැඩසටහන මගින් සිදුවේ.

මෙහි මූලික වැඩසටහන් අතර ප්‍රාදේශීය මට්ටමෙන් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීමත් දිස්ත්‍රික් මට්ටමෙන් ළමා සමාජ ළමා සභා ඔස්සේ ආපදා අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පෙර සූදානම් ශක්තිමත් කිරීමටත් අදාල වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව ළමා සමාජ නියෝජිත දරුවන් සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් 417 ක් පුහුණු වැඩසටහන් 10 ක් පවත්වමින් සහ රු. 963,963.00 මුදලක් වැය කරමින් 2018 වර්ෂය තුළ පැවැත්විණ.

## 5.19 ළමා හිංසනය අවසන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සංවිධානය (South Asia Initiatives to End Violence Against Children – SAIEVAC)

ළමා හිංසනය අවසන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සංවිධානය 2005 වර්ෂයේදි සාර්ක් කලාපීය රටවල් ඒකාබද්ධ එකගතාවයකින් යුක්තව පිහිටුවා ගෙන ඇති අතර ශ්‍රී ලංකා රජයෙහි නියෝජිත ආයතනය ලෙස කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයත් එහි පූර්ණ මගපෙන්වීම යටතේ යෝජිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව කටයුතු කරයි. කලාපීය වශයෙන් හඳුනා ගන්නා ලද ළමා විවාහ, ළමා ශ්‍රමය, කායික දණ්ඩනය, ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම සහ කුට්ඨණය යන මූලික ගැටළු කිහිපයක් මුල් කරගනිමින් මෙම SAIEVAC සංවිධානය ක්‍රියාත්මක වේ.

ළමා ශ්‍රමය කලාපීය වශයෙන් පිටුදැකීම, ළමා විවාහ පිටුදැකීම, ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම සහ අන්තර්ජාලය තුළ දරුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම යන ගැටළු පදනම් කරගනිමින් කලාපීය ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කොට ඇත. මෙම ක්‍රියාකාරි සැලස්ම සකස් කිරීමේ ක්‍රමවේදය තුළ පවත්නා තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව සත්කාරක රට ලෙස ඉදිරිපත් වේ. ඒ අතර 2018 දී අගෝස්තු මස කොළඹදී පැවැත්වූ ළමා ලිංගික අපයෝජනය සහ සූරාකෑම සහ අන්තර්ජාලය තුළ දරුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ තෙවන කලාපීය තාක්ෂණික ප්‍රවීණයන් සමග පැවැති රැස්වීම සඳහා සත්කාරක රට ලෙස මෙම ශ්‍රී ලංකාව ඉදිරිපත් වෙමින් එහි සම්බන්ධීකරණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදි.

## 5.20 මාසික සහ වාර්ෂික ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන මාර්ගගත දත්ත පද්ධතිය (Online Database)

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මාසික සහ වාර්ෂික ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වන මාර්ගගත දත්ත පද්ධතියක් (Online Database) සකස් කරනු ලැබීය. දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් විසින් වාර්තා කිරීමට නියමිත මාසික සහ වාර්ෂික ප්‍රගතිය මෙතෙක් ලිඛිතව දෙපාරතමේන්තුවට ඉදිරිපත් කළ අතර වාර්ථාකරණය තවදුළුරටත් කාර්යක්ෂම කිරීම අරමුණු කරගනිමින් මෙම දත්ත පද්ධතිය සකස් කරන ලදි. ඒ අනුව 2019 වර්ෂයේ සිට මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 5.21 ශ්‍රී ලාංකික දරුවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික සිද්ධි කලමනාකරණ මාර්ගෝපදේශ

ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව දශක හයකට වඩා වැඩි කාලයක සිට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි. වර්තමාන සංකීර්ණ සමාජ ආර්ථික වටපිටාව තුළ දරුවන් මුහුණදෙන අර්බුදකාරි තත්ත්වයන් ද දිනෙන් දින සංකීර්ණ වන ආකාරයක් හඳුනාගත හැකිය. දරුවන් මුහුණුදෙන එම අභියෝග පරාජය කරමින්

ඔවුන්ට වඩාත් ළමා හිතමිතුරු පරිසරයක් නිර්මාණය කරදීමට නම් ඒ වෙනුවෙන්ම වන නව ශිල්පීය ක්‍රමවේද හඳුනා ගැනීම ද වැදගත් වෙයි.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මෙම අරමුණ ඇතිව 2016 වර්ෂයේදී ශ්‍රී ලාංකික දරුවන්ට එරෙහි සියළු ආකාරයේ හිංසනයන් වැළැක්වීම පිළිබඳ ජාතික සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීමට කටයුතු ආරම්භ කරන ලදී. එය ළමුන්,රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් ඇතුළු ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන පිරිස් සහභාගිකර ගනිමින් වැඩමුළු ගණනාවක් පවත්වා අවසන් වශයෙන් සකස්කර 2018 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී. 2018.06.05 දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 18/1093/833/003 යටතේ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇත.

ළමුන්ට එරෙහි සියළු ආකාරයේ හිංසනයන් වැලැක්වීම පිළිබඳ මෙම ජාතික සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහය සිංහල දෙමල හා ඉංග්‍රීසි බසින් මුද්‍රණය කර සියළුම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් /සහකාරවරුන් පුහුණු කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. 2018 වර්ෂය තුළ බස්නාහිර හා දකුණු පලාත් නිලධාරීන් පුහුණු කරනු ලැබූ අතර 2019 අප්‍රේල් මාසය වනවිට සියළුම නිලධාරීන්ගේ පුහුණු කටයුතු අවසන් කිරීමට ඇස්තමේන්තු කර ඇත. මෙම සමස්ත වැඩසටහන සඳහා ළමුන්ගේ සමාජ ආරක්ෂාව සඳහා වූ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇත.

## 5.22 තුන් අවුරුදු ප්‍රාදේශීය සැලසුම

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය මගින් ළමා අපයෝජනය සම්බන්ධව මෑතකදී සිදු කරන ලද සමීක්ෂණයකට අනුව පහත සඳහා හේතු සාධක කරන කොට ගෙන ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් ළමා අපයොජනයන් සිදු වන බව හඳුනා ගෙන ඇත

එනම්,

01අනිවාර්යය අධ්‍යාපනය නොලැබීම


02 ලිංගික හිංසනය හා කායික දණ්ඩනය බහුලවීම

03 අවුරුද 18 අඩු වයසේ දරුවන් අතරේ අඩු වයස් ගැබ් ගැනීම් බහුල වීම

අඩු වයස් විවාහ නිසා ගැටලු රාශියක් පැන නැගී ඇති අතර දරුවන් පාසල් අධ්‍යාපනය අතරමඟ හැරයාමේ ප්‍රවනතාවක් ද දක්නට ඇති බව හඳුනා ගෙන ඇත.

ඒ අනුව සෑම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයක්ම අවරණය වන පරිදි ඉදිරි අවුරුදු 03 ක් සඳහා (2018/2019/2020) ළමාරක්ෂණය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අමත්‍යාංශය මගින් ප්‍රා ප්‍රාදේශීය නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. එසේ සකස් කරන ලද ප්‍රාදේශීය සැලසුම් සඳහා අමාත්‍යාංශය හා පරිවාස දෙපාර්තමේන්තුව මගින් වාර්ෂික ප්‍රතිපාදන ලබා දෙන ලදි.ඒ අනුව පහත සඳහන් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදි.

| 3 අවුරුදු ප්‍රාදේශීය සැලසුම් සඳහා ප්‍රතිපාදන යැවීම 2018 | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | මුදල (රු) | වැඩසටහන් ගණන |
| මොනරාගල | 127,780.00 | 48 |
| කෑගල්ල | 20,000.00 | 21 |
| රත්නපුර | 357,815.00 | 58 |
| බදුල්ල | 528,000.00 | 52 |
| පුත්තලම | 456,420.00 | 38 |
| මාතලේ | 98,250.00 | 44 |
| මුලතිව් | 52,500.00 | 8 |
| කුරුනෑගල | 333,900.00 | 21 |
| හම්බන්තොට | 255,000.00 | 68 |
| මාතර | 345,000.00 | 75 |
| කළුතර | 65,000.00 | 12 |
| කොළඹ | 183,300.00 | 39 |
| ත්‍රිකුණාමලය | 130,000.00 | 48 |
| මඩකලපුව | 40,000.00 | 33 |
| ගාල්ල | 8,000.00 | 05 |
| එකතුව | **3,000,965.00** | **570** |



## 5.23 නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාසවාසී දරුවන්ගේ ළමා ආරක්ෂාව සහතික කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මෙම දෙපාර්තමේන්තුව ළමුන්ගේ ආරක්ෂාව සංවර්ධනය මෙන්ම ඔවුන්ගේ අයිවාසිකම් සහතික කරමින් ළමුන්ට හිතකර සමාජ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරමින් පවතී. නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කරනු ලබන නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක මහල්නිවාස ආශ්‍රිතව මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

1. මහල් නිවාස ආශ්‍රිතව ළමා සමාජ පිහුටුවීම
2. ළමා පුස්තකාල ආරම්භ කිරීම සඳහා පහසුකම් ලබාදීම
3. සාක්ෂරතා පන්ති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම
4. ළමා මිතුරු මධස්ථාන සඳහා පහසුකම් ලබාදීම
5. ළමුන්ගේ හා දෙමාපියන්ගේ මූලික ලේඛන ලබා ගැනීම සඳහා ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරීම සඳහා පහසුකම් ලබාදීම

ඒ අනුව පළමු අදියර ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මිහිඳුසෙන්පුර මහල් නිවාසයේ හා කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිරිමුතු උයන මහල් නිවාසයේ ආරම්භක වැඩසටහන් වශයෙන් ජංගම සේවා 02ක් (දෙකක්) පවත්වා අවශ්‍ය පහසුකම් සම්පාදනය කරදෙන ලදී. මේ වෙනුවෙන් දෙපාර්තමේන්තුව රු. 251,000.00 වියදම් දරනු ලදී.